NDB බැංකුව
අනාගත බැංකුකරණයේ පෙරගමන්කරු

# කාඩ්පත්හිමියා සම්බන්ධයෙන් වන ගිවිසුම

## නියම සහ කොන්දේසි

සැලකිය යුතුය :- සමාගම් ලියාපදිංචි අංක පී. කිව් 27 දරන නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය විසින් නිකුත් කරන ලද ආවරණය කළ කාඩ්පත ඔබ විසින් අත්සන් කිරීමට හෝ භාවිත කිරීමට පෙර, කරුණාකර මෙම කාඩ්පත්හිමියා සම්බන්ධයෙන් වන ගිවිසුම (ගිවිසුම) හොඳින් කියවන්න. මේ කාඩ්පත පිළිගැනීම සහ/හෝ අත්සන් කිරීම සහ/හෝ භාවිත කිරීම මගින් ඔබ මේ ගිවිසුමේ නියම සහ කොන්දේසි පිළිගැනීමට යටත්වන අතරම එම නියම සහ කොන්දේසිවලින් බැඳී සිටිනු ලැබේ.

## 1. අර්ථනිරූපණ

1.1 "ATM යන්ත්‍රය" යන්නෙන්, බැංකුවට හෝ බැංකුව විසින් කලින් කල නම් කරනු ලබන වෙනත් යම් සහභාගී වන බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට අයත්, කාඩ්පත පිළිගනු ලබන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හෝ යම් කාඩ්පතක් මගින් ක්‍රියාකරන යන්ත්‍රයක් හෝ උපකරණයක් අදහස් වේ.

1.2 "ඉල්ලුම්කරු" යන්නෙන්, කාඩ්පත් ඉල්ලුම්පත්‍රයට අත්සන් කර ඇති යම් තැනැත්තකු අදහස් වේ.

1.3 "බැංකුව" යන්නෙන්, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය, එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

1.4 "කාඩ්පත" යන්නෙන්, බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පතක් අදහස් වන අතර, ඊට ප්‍රාථමික, අතිරේක සහ ආදේශක කාඩ්පතක් හෝ කාඩ්පත් ද ඇතුළත් වේ.

1.5 ''කාඩ්පත් ගිණුම'' යන්නෙන්, කාඩ්පත් ගනුදෙනු සඳහා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක් හෝ ගිණුම් අදහස් වේ.

1.6 ''ඇමතුම් මධ්‍යස්ථානය'' යන්නෙන්, බැංකුව විසින් ස්වකීය ගනුදෙනුකරුවන්ගේ/උනන්දුවක් දක්වන්නන්ගේ විමසීම් සහ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවන ලද දුරකතන සම්බන්ධතා මධ්‍යස්ථානය අදහස් වේ.

1.7 ''කාඩ්පත් මධ්‍යස්ථානය'' යන්නෙන්, එන්.ඩී.බී බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් මධ්‍යස්ථානය අදහස් වේ.

1.8 ''ප්‍රාග්ධන ගනුදෙනුව'' යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථානුකූලව ජංගම ගනුදෙනුවක් නොවන යම් ගනුදෙනුවක් අදහස් වේ.

1.9 ''කාඩ්පත්හිමියා'' යන්නෙන්, මේ ගිවිසුම ප්‍රකාර බැංකුව විසින් තම නමට කාඩ්පතක් නිකුත් කරනු ලැබ ඇත්තාවූ ද, කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් වන සියලු ගනුදෙනු සහ බැරකම් පිළිබඳ වගකීම දරන්නාවූ ද තැනැත්තකු අදහස් වන අතර, ඊට ප්‍රාථමික සහ අතිරේක කාඩ්පත්හිමියකු ද ඇතුළත් වේ.

1.10 ''කාඩ්පත් ගනුදෙනුව'' යන්නෙන්, විකුණුම් පත්‍රිකාව හෝ මුදල් අත්තිකාරම් හෝ වෙනත් වවුචර්පත්‍රය හෝ ආකෘතිපත්‍රය කාඩ්පත්හිමියා විසින් අත්සන් කරනු ලැබුවද නොලැබුවද, කාඩ්පත හෝ කාඩ්පත් අංකය සහ/හෝ PIN අංකය භාවිත කිරීමෙන් සහ/හෝ කාඩ්පත්හිමියා විසින් අවසර දෙනු ලැබූ හෝ සිදුකරනු ලැබූ විද්‍යුත් තැපැල්, දුරකතන හෝ ෆැක්ස් ඇණවුම් හෝ වෙන්කිරීම් ද ඇතුළු එහෙත් ඊට සීමා නොවූ වෙනත් යම් ආකාරයකින් භාණ්ඩ සහ/හෝ සේවා හෝ ප්‍රතිලාභ මිලදීගැනීම හෝ වෙන්කිරීම් සිදුකිරීම (කාඩ්පත්හිමියා විසින් භාවිත කරනු ලැබූවද නොලැබුවද, කාඩ්පත්හිමියා විසින් කුලියට ගනු ලබන හෝ බද්දට ගනු ලබන ගුවන්, නැව්, දුම්රිය, මෝටර් රථ හෝ වෙනත් ප්‍රවාහන ක්‍රමයක් හෝ හෝටලයක්

හෝ වෙනත් ලැගුම්හලක් හෝ නවාතැනක් සඳහා සිදුකරන ලද යම් වෙන්කිරීමක් ද ඇතුළු එහෙත් ඊට සීමා නොවූ) සහ/හෝ මුදල් අත්තිකාරම් ලබා ගැනීම.

1.11 ''මුදල් අත්තිකාරම්'' යන්නෙන්, කාඩ්පත්හිමියා විසින් කාඩ්පත, කාඩ්පත් අංකය හෝ PIN අංකය භාවිත කිරීමෙන් බැංකුවේ හෝ වෙනත් යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ATM යන්ත්‍රයකින් මුදල් ලබාගෙන එය කාඩ්පත් ගිණුමෙන් හර කිරීමේ ක්‍රියාවක් අදහස් වේ.

1.12 ''ගාස්තු'' යන්නෙන්, සියලුම කාඩ්පත් ගනුදෙනුවලට අදාළ ගාස්තු, පොලී, බදු, අයබදු, අතිරේක වියදම්, අලාභ, නඩු ගාස්තු, වියදම් ඇතුළු එහෙත් ඊට සීමා නොවූ, කාඩ්පත හෝ කාඩ්පත් අංකය හෝ PIN අංකය භාවිත කිරීම මගින් හෝ මේ නියම සහ කොන්දේසි යටතේ හෝ ජනිත වන කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතුවූද, කාඩ්පත් ගිණුමෙන් හර කරනු ලබන්නාවූ ද සහ දැනට පවත්නා ශේෂයේ කොටසක් වන්නාවූ ද මුදල් අදහස් වේ.

1.13 ''ආයතනික කාඩ්පත'' යන්නෙන්, සුදුසුකම්ලත් සංස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලය, විධායක නිලධරයන් අධ්‍යක්ෂවරුන් හෝ එම සංස්ථාපිත මණ්ඩලය විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද කාඩ්පත හෝ කාඩ්පත් අදහස් වේ.

1.14 ''ණය සීමාව'' යන්නෙන්, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි ප්‍රාථමික කාඩ්පත්වලට සහ අතිරේක කාඩ්පතක් හෝ අතිරේක කාඩ්පත් කිසිවක් ඇත්නම් එම අතිරේක කාඩ්පතට හෝ අතිරේක කාඩ්පත්වලට අදාළව කාඩ්පත් ගිණුම සඳහා අවසරදී ඇත්තාවූද, බැංකුව විසින් කලින් කල ප්‍රාථමික කාඩ්පත්හිමියාට දැනුම් දෙනු ලබන්නාවූද උපරිම හර ශේෂය අදහස් වේ.

1.15 ''ඒකාබද්ධ ණය සීමාව'' යන්නෙන්, බැංකුව විසින් කලින් කල නියම කරනු ලබන පරිදි කාඩ්පත්හිමියා විසින් දරනු ලබන සියලු කාඩ්පත් ගිණුම්වලට අදාළවන සීමාව අදහස් වේ.

1.16 ''දැනට පවත්නා ශේෂය'' යන්නෙන්, කාඩ්පත් ගිණුමට අදාළව ගෙවිය යුතුව ඇති (සත්‍ය වුවද අවිනිශ්චිත වුවද සහ දැනටමත් දරා ඇති වුවද අනාගතයේදී දරනු ලැබිය යුතු වුවද වන සියලු කාඩ්පත් ගනුදෙනු, පොලී, ගාස්තු, අයකිරීම්, පිරිවැය, අයබදු සහ නඩු ගාස්තු ඇතුළු වියදම් ද ඇතුළු එහෙත් ඊට සීමා නොවූ) මුලු හර ශේෂය අදහස් වේ.

1.17 ''තැන්පතුව'' යන්නෙන්, කාඩ්පතක් නිකුත් කිරීමේ කාර්යය සඳහා සහ/හෝ කාඩ්පත්හිමියාගේ බැඳියාවන් ඉටුකිරීම සඳහා ඇපයක් වශයෙන් බැංකුවෙහි තබා ඇති මුදල අදහස් වේ.

1.18 ''කණ්ඩායම් සාමාජිකයා'' යන්නෙන්, බැංකුවේ පාලිත හෝ ආශ්‍රිත සමාගමක් අදහස් වේ.

1.19 ''ඇපකරය'' යන්නෙන්, බැංකුවක්, සංස්ථාපිත මණ්ඩලයක්, ව්‍යාපාර ආයතනයක්, තැනැත්තකු හෝ බැංකුව විසින් පිළිගත් වෙනත් යම් මූල්‍ය ආයතනයක් විසින් කාඩ්පතක් හෝ කාඩ්පත් නිකුත් කිරීමේ කාර්යය සඳහා සහ/හෝ කාඩ්පත්හිමියාගේ බැඳියාවන් ඉටු කිරීම සඳහා ඇපයක් වශයෙන් බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති මුදලක් සඳහා බැංකුව විසින් පිළිගත් ආකෘතියකින් සහ තත්ත්වයකින් බැංකුවේ නමට ලබාදී ඇති ඇපකරයක් ඇත්නම්, එම ඇපකරය අදහස් වේ.

1.20 ''ජීවිත කාලය පුරාවටම නොමිලේ සපයනු ලබන දීමනාව'' යන්නෙන්, කාඩ්පත්හිමියාට කාඩ්පතේ ජීවිත කාලය පුරාවටම වාර්ෂික ගාස්තු ගෙවීමෙන් නිදහස් වීමට හිමිකම් සලසන විශේෂ දීමනාවක් අදහස් වේ.

1.21 ''වෙළෙන්දා'' යන්නෙන්, කාඩ්පත්හිමියා විසින් ගෙවීම් සිදුකිරීමේ ක්‍රමයක් ලෙස කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාරගැනීම මගින් භාණ්ඩ සහ/හෝ

සේවා විකිණීම සඳහා බැංකුව විසින් පිළිගත් යම් සංස්ථාපිත අස්තිත්වයක්, ව්‍යාපාර ආයතනයක්, තැනැත්තකු හෝ වෙනත් යම් ආයතනයක් අදහස් වේ.

1.22 ‘‘ගෙවිය යුතු අවම මුදල’’ යන්නෙන්, ගෙවීම සිදුකළ යුතු දිනය වන විට ගෙවනු ලැබුවහොත් යම් ප්‍රමාද ගාස්තුවක් ගෙවීමෙන් වැළකී සිටිය හැකි වන අවම මුදලට යටත් වන දැනට පවත්නා ශේෂයේ ප්‍රතිශතය අදහස් වේ. නියමිත දිනයට නොගෙවූ මුදලක් ඇත්නම්, එය ගෙවිය යුතු අවම මුදලට ඇතුළත් වේ.

1.23 ‘‘මාසය’’ යන්නෙන්, ලිත් මාසයක් අදහස් වේ.

1.24 "නියමිත දිනයට නොගෙවූ මුදල" යන්නෙන්, කාඩ්පත්හිමියාගේ පෙර ගිණුම් ප්‍රකාශයේ යම් හිඟ මුදලක් වෙතොත්, එම මුදල අදහස් වේ. ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන යම් නියමිත දිනයට නොගෙවූ මුදලක්, ගෙවිය යුතු අවම මුදලට ඇතුළත් වන අතර, එය නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

1.25 "අධිසීමා මුදල" යන්නෙන්, ණය සීමාව ඉක්මවූ දැනට පවත්නා ශේෂය අදහස් වේ.

1.26 "අධිසීමා ගාස්තුව’’ යන්නෙන්, කාඩ්පත්හිමියා විසින් ණය සීමාව ඉක්මවා ඇති අවස්ථාවක බැංකුව විසින් අයකරනු ලබන ගාස්තුවක් අදහස් වේ.

1.27 ‘‘ගෙවීම සිදුකළ යුතු දිනය’’ යන්නෙන්, දැනට පවත්නා ශේෂය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවිය යුතු අවම මුදල බැංකුවට ගෙවනු ලැබිය යුතු දිනය ලෙස ගිණුම් ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති දිනය අදහස් වේ. ගෙවීම සිදුකළ යුතු දිනය බැංකු නිවාඩු දිනයක් හෝ සති අන්තයක් වූ අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින් ගෙවීම සිදුකළ යුතු දිනය එම නිවාඩු දිනයෙන්/සති අන්තයෙන් පසුව එළඹෙන පළමුවන වැඩකරන දිනය වන්නේ ය.

1.28 " PIN අංකය" යන්නෙන්, ATM යන්ත්‍රයකදී හෝ POS පර්යන්තයකදී කාඩ්පත ඉලෙක්ට්‍රොනික ලෙස භාවිත කිරීමට හැකි කරවීම සඳහා කාඩ්පත්හිමියා වෙත නිකුත් කරනු ලබන පෞද්ගලික හඳුනාගැනීමේ අංකය අදහස් වේ.

1.29 "POS පර්යන්තය" යන්නෙන්, කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනික ලෙස සකස් කරනු ලබන යම් විකුණුම් ස්ථාන පර්යන්තයක් අදහස් වේ.

1.30 "ප්‍රාථමික කාඩ්පත්හිමියා" යන්නෙන්, කාඩ්පත් ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ යම් කාඩ්පත්හිමියෙකුගේ නමින්ද, එම කාඩ්පත්හිමියා සහ ඔහුගේ/ඇයගේ උරුමක්කරුවන්, පැවරුම්ලාභීන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් වේ.

1.31 "නිෂ්පාදන සලකුණ" යන්නෙන්, කාඩ්පත නිකුත් කරනු ලබන්නේ යම් ගෙවීම් ජාලයක් මාර්ගයෙන්ද, එම ගෙවීම් ජාලයේ සලකුණ අදහස් වේ.

1.32 "ඇපය" යන්නෙන්, කාඩ්පතක් නිකුත් කිරීමේ කාර්යය සඳහා සහ/හෝ කාඩ්පත්හිමියාගේ බැඳියාවන් ඉටුකිරීම සඳහා ඇපයක් වශයෙන් තබා ඇති තැන්පතුව හෝ ඇපකරය අදහස් වේ.

1.33 "ගිණුම් ප්‍රකාශය" යන්නෙන්, බැංකුවට ගෙවිය යුතු දැනට පවත්නා ශේෂයේ විස්තර දක්වමින් එක් එක් කාඩ්පත් ගිණුම සඳහා කාඩ්පත්හිමියා වෙත යවනු ලබන බැංකුවේ මාසික හෝ කාලානුරූපී ප්‍රකාශය අදහස් වේ.

1.34 "ප්‍රකාශයේ දිනය" යන්නෙන්, ගිණුම් ප්‍රකාශය අදාළ වන බිල්පත් යැවීමේ කාල චක්‍රයේ අවසාන දිනය වන දිනය අදහස් වන අතර, ඊට එම දිනයේදී ව්‍යාපාර කටයුතු අවසන් කරන තෙක් බැංකුව විසින් සකසන ලද සියලු සටහන්ද ඇතුළත් වේ.

1.35 "අතිරේක කාඩ්පත" යන්නෙන්, ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් නම් කරන ලද තුන්වන පාර්ශ්වයක් වෙත බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පතක් අදහස් වේ.

1.36 "අතිරේක කාඩ්පත්හිමියා" යන්නෙන්, අතිරේක කාඩ්පතක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙතද, එම තැනැත්තා අදහස් වේ.

1.37 "පර්යන්තය" යන්නෙන්, කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනික ලෙස ඉටුකළ හැකි යම් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) හෝ විකුණුම් ස්ථාන (POS) අදහස් වේ.

1.38 "ගනුදෙනුව සිදුකළ දිනය" යන්නෙන්, කාඩ්පත්හිමියා සහ වෙළෙන්දා අතර කාඩ්පත් ගනුදෙනුව සිදුවූ දිනය අදහස් වේ.

1.39 "ගනුදෙනු සැකසුම් දිනය" යන්නෙන්, කාඩ්පත් ගනුදෙනුව කාඩ්පත් ගිණුමට සකස් කරනු ලබන දිනය අදහස් වේ.

1.40 "පහසුකම" යන්නෙන්, පහසුකම්, භාණ්ඩ සහ ජලය, විදුලිය සහ සන්නිවේදන සේවා ඇතුළු එහෙත් ඊට සීමා නොවූ සේවා සපයන යම් සමාගමක්, අධිකාරියක් හෝ අස්තිත්වයක් අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස, මේ ගිවිසුමේ ඒක වචනයෙන් කර ඇති සියලු සඳහන්වලට, අදාළ විටදී, බහුවචනය ද ඇතුළත් විය යුතු අතර, ස්ත්‍රී පුරුෂභාවයට කර ඇති සියලු සඳහන්වලට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයමද අලිංගය ද ඇතුළත් විය යුතු ය.

## 2. කාඩ්පත

2.1 කාඩ්පත බැංකුවේ දේපළක් වන අතර, බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබූ විටකදී කාඩ්පත්හිමියා විසින් එය නොපමාව බැංකුව වෙත ආපසු ලබාදෙනු ලැබිය යුතු ය.

2.2 කාඩ්පත පැවරිය නොහැකි අතර, එය කාඩ්පත්හිමියා විසින්ම පමණක් භාවිත කරනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් කිසිදු අවස්ථාවකදී වෙනත් යම් තැනැත්තකුට කාඩ්පත සහ/හෝ PIN අංකය භාවිතා කිරීමට අවසර ලබා දෙනු

නොලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් කිසිදු කාර්යයක් සඳහා කාඩ්පත ඇපයක් ලෙස ලබාදෙනු නොලැබිය යුතු ය.

2.3 බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි පූර්ව දැනුම්දීමකින් හෝ හේතු දැක්වීමකින් තොරව, ඕනෑම විටෙකදී කාඩ්පත සහ කාඩ්පත භාවිත කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිවාසිකම අවලංගු කිරීමද, යම් කාඩ්පත් ගනුදෙනුවකට අවසර ලබාදීම සඳහා වන යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමද කරනු ලැබිය හැකි ය.

2.4 බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි කාඩ්පත නැවත නිකුත් කිරීම, අලුත් කිරීම හෝ තිබෙන කාඩ්පත වෙනුවට වෙනත් කාඩ්පතක් ලබාදීම හෝ ඉහත දෑ කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

2.5 කාඩ්පත්හිමියා විසින්, සෑම විටකදීම කාඩ්පත සුරක්ෂිත ස්ථානයක තබා ඇති බවට වගබලා ගනු ලැබිය යුතු ය.

**3. කාඩ්පත භාරදීම සහ භාවිත කිරීම**

3.1 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත බැංකුවෙන් ලබාගත හැකි ය; නැතහොත් කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත දැනුම්දෙනු ලැබූ ලිපිනයට තැපැල් මාර්ගයෙන් හෝ කුරියර් මාර්ගයෙන් යවනු ලැබිය හැකි ය. එසේම, කාඩ්පත්හිමියාගේ වගකීම යටතේ නම් කරන ලද තුන්වන පාර්ශ්වයක් විසින් කාඩ්පත ලබාගැනීම හෝ එවැනි තුන්වන පාර්ශ්වයකට කාඩ්පත භාරදීමද කරනු ලැබිය හැකි ය.

3.2 කාඩ්පත ලැබුණු පසු, කාඩ්පත්හිමියා විසින් ඇමතුම් මධ්‍යස්ථානය අමතා කාඩ්පත සක්‍රීය කරගනු ලැබිය යුතු ය.

3.3 කාඩ්පත සක්‍රීය කිරීම සහ/හෝ භාවිත කිරීම, මෙහි සඳහන් නියම සහ කොන්දේසි පිළිගත් බවට වූ බන්ධනීය සහ තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

3.4 කාඩ්පත්හිමියා මෙහි සඳහන් නියම සහ කොන්දේසිවලට යටත් වන අතර, ඔහු විසින්, මෙහි සඳහන් ස්වකීය වගකීම් වෙනත් කිසිවකුට පවරනු නොලැබිය යුතු ය.

3.5 කාඩ්පත්හිමියා විසින් මේ නියම සහ කොන්දේසිවලට යටත්වීමට කැමැත්ත පළ නොකරන අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, කාඩ්පතෙන් අඩක් කපා එය බැංකුව වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු අතර, එතැන් සිට, මෙහි 18 වන වගන්තිය (අවසන් කිරීම) ක්‍රියාත්මක වන්නේ ය.

3.6 කාඩ්පත, භාවිත කරන අවස්ථාවේ දී මේ ගිවිසුමේ සියලු නියමවලට යටත් වේ.

3.7 කාඩ්පත, ණය සීමාව ඇතුළත පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.

3.8 කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත භාවිත කිරීම සම්බන්ධයෙන් කලින් කල බැංකුව විසින් සපයනු ලබන පහසුකම් සහ ප්‍රතිලාභ ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

3.9 කාඩ්පතේ කැටයම් කර දක්වා ඇති වලංගු කාලසීමාව තුළදී, බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, පූර්ව දැනුම්දීමකින් තොරව, ඕනෑම විටක දී කාඩ්පත භාවිත කිරීමේ අයිතිවාසිකම අවලංගු කර, නැතහොත් යම් කාඩ්පත් ගනුදෙනුවකට අවසර ලබාදීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර, එම අවලංගු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පළ කරනු ලැබිය යුතු ය.

3.10 කාඩ්පත්හිමියා විසින් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා හෝ වාණිජ කාර්ය සඳහා භාණ්ඩ ආනයනය කිරීම සඳහා මේ කාඩ්පත භාවිත කරනු නොලැබිය යුතු ය.

3.11 ශ්‍රී ලංකාවෙන් පිටත දී කාඩ්පත භාවිත කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් නියාමන මණ්ඩලයක් විසින් කලින් කල නියම කරනු ලබන පරිදි විය යුතු ය. යම් අයිතිවාසිකමකට, ප්‍රතිකර්මයකට හෝ ශ්‍රී ලංකා මහා බැංකුව, බැංකුව,

අධිකරණය හෝ යම් නියාමන නියෝජ්‍යායතනයක් විසින් කාඩ්පත්හිමියාට විරුද්ධව පවරන නඩුවකට අගතියක් නොමැතිව, සියලු හිඟ මුදල් ගෙවා අවසන් කිරීමට ද කාඩ්පත්හිමියා යටත් විය යුතු ය.

3.12 එකී කාලය අවසන්වීමේ දිනය තෙක් කාඩ්පත් ගිණුම නිසි කලට මුදල් ගෙවා ඇති ගිණුමක තත්ත්වයෙන් පවතින්නේ නම්, කාඩ්පතේ කැටයම් කර දක්වා ඇති කාලය අවසන්වීමේ දිනය තෙක් කාඩ්පත කාඩ්පත් ගනුදෙනු සඳහා භාවිතා කරනු ලැබිය හැකි ය.

3.13 කාඩ්පත්හිමියා විසින්, සෑමවිටකදීම, කාඩ්පත සහ බැංකුව සම්බන්ධයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනුවලදී සද්භාවයෙන් කටයුතු කිරීමට එකඟවනු ලැබේ.

## 4. ණය සීමාව සහ ඒකාබද්ධ ණය සීමාව

4.1 (අ) ණය සීමාව බැංකුවේ පරම අභිමතය පරිදි නිශ්චය කරනු ලබන අතර, එය කාඩ්පත්හිමියාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ලිඛිත දැනුම්දීමක් කරමින් කලින් කල ණය සීමාව වැඩි කිරීමේ හෝ අඩු කිරීමේ අයිතිවාසිකම ද බැංකුව සතු වන්නේ ය. බැංකුව විසින්, කාඩ්පත් ගිණුමේ මුළු ණය සීමාව ඇතුළත මුදල් අත්තිකාරම් සහ මිලදීගැනීම් සඳහා වෙන වෙනම සීමාවන් ද නියම කරනු ලැබිය හැකි ය.

(ආ) ණය සීමාව ඉක්මවා ඇත්ද යන්න ගණනය කිරීමේදී, බැංකුව විසින්, කාඩ්පත් ගිණුමට තවමත් බිල්පත් යවා නොමැති යම් කාඩ්පත් ගනුදෙනුවලට අදාළ මුදලක් සහ අපේක්ෂිත කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකුව විසින් තුන්වන පාර්ශ්වයක් වෙත ලබා දී ඇති යම් අවසරයක් ඇතුළු දැනට පවත්නා ශේෂය සහ කාඩ්පත්හිමියා විසින් කරන ලද ඉල්ලීමක් අනුව එළඹීමට නියමිත ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් වෙන් කරන ලද යම් මුදලක් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

4.2 මේ ගිවිසුම අවසන් කරනු ලැබුව ද, කාඩ්පත්හිමියා විසින් කාඩ්පත සඳහා බැංකුව විසින් ප්‍රදානය කරන ලද සියලු ණය පහසුකම් සඳහා වගකීම දරනු

ලැබිය යුතු අතර, මේ ගිවිසුම යටතේ වන ඒ හා සම්බන්ධ සියලු ගාස්තුවලටද යටත් විය යුතු ය.

4.3 ඒකාබද්ධ ණය සීමාව, කලින් කල බැංකුව විසින් දැනුම් දෙනු ලබන පරිදි කාඩ්පත්හිමියා විසින් දරනු ලබන සියලු කාඩ්පත් ගිණුම්වල දැනට පවත්නා ශේෂ සඳහා අවසර දී ඇති උපරිම ණය සීමාව වන්නේ ය.

4.4 දැනට පවත්නා ශේෂය, ගිණුම් ප්‍රකාශය නිකුත් කරන දිනට බැංකුවේ වාර්තා අනුව බැංකුවට ගෙවනු ලැබිය යුතු ය.

4.5 කාඩ්පත්හිමියා විසින්, ණය සීමාවේ මුළු ඉතිරි ශේෂය ඉක්මවා යාමට හේතුවිය හැකි යම් මිලදීගැනීම් හෝ ගනුදෙනු සිදුකරනු නොලැබිය යුතු ය.

4.6 කාඩ්පත්හිමියා විසින් එම ණය සීමාව ඉක්මවායාම සඳහා පූර්ව ලිඛිත අනුමතය ලබාගෙන ඇත්නම් මිස, කාඩ්පත්හිමියා විසින්, සෑමවිටකදීම බැංකුව විසින් ලබා දී ඇති නියම කරන ලද ණය සීමාව ඇතුළත කාඩ්පත භාවිත කරනු ලැබිය යුතු ය.

4.7 බිල්පත් යැවීමේ කාලසීමාව ඇතුළත යම් අවස්ථාවකදී ලබාදී ඇති ණය සීමාව ඉක්මවා ඇත්නම්, බැංකුව විසින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයක් මත අධිසීමා ගාස්තුවක් අයකර, එය කාඩ්පත් ගිණුමෙන් හර කරනු ලැබිය යුතු ය.

4.8 මේ කාර්යය සඳහා, ණය සීමාව ඉක්මවා ඇත්ද යන්න ගණනය කරන විටදී සියලු බැංකු ගාස්තු ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

4.9 කාඩ්පත් ගිණුමෙන් ලබාගත හැකි ණය මුදල, ඉතිරි ශේෂය සහ බැංකුව විසින් දැනටමත් භාරගෙන ඇති එහෙත් එදිනට සැකසීම සඳහා ලැබී නොමැති යම් කාඩ්පත් ගනුදෙනුවක් සැලකිල්ලට ගැනීමෙන් පසු, යම් නිශ්චිත අවස්ථාවකදී ණය සීමාවේ භාවිත කර නොමැති අගය වන්නේ ය. මුදල් අත්තිකාරම් සහ මිලදීගැනීම් සඳහා වෙන වෙනම සීමා නියම කර ඇති අවස්ථාවක, ලබාගත හැකි ණය මුදල ද එසේ බෙදනු ලැබිය යුතු ය. සෑම විටකදීම තමා කාඩ්පත් ගිණුමෙන් ලබාගත හැකි ණය මුදල (අදාළ විටදී අත්තිකාරම් සහ

මිලදීගැනීම් ද ඇතුළුව) ඇතුළත් රැඳෙන පරිදි කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් ගනුදෙනු සිදුකරන බවට කාඩ්පත්හිමියා විසින් වග බලා ගනු ලැබිය යුතු ය.

## 5. බිල්පත් යැවීම සහ ගෙවීම

5.1 බැංකුව විසින්, කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් මුදල් ආපසු ලබාදීමක් හෝ කාඩ්පත්හිමියාට ලැබිය යුතු යම් ගෙවීමක් හෝ වෙනත් ණයක්, එම මුදල් ආපසු ලබාදීම, ගෙවීම හෝ ණය ලැබීමෙන් සහ අවශ්‍ය විටදී එම මුදල ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් පසු, ස්වකීය සාමාන්‍ය පිළිවෙතට අනුකූලව බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලයකදී මේ ගිවිසුමේ නියමයන්ට යටත්ව කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබිය යුතු ය. තවද, බැංකුව විසින් අන්‍යාකාරයකින් නිශ්චය කරනු ලබන්නේ නම් මිස, එම මුදල කාඩ්පත්හිමියා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, දැනට පවත්නා ශේෂය සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ගෙවා නිම කිරීම සඳහා එම මුදල යොදා ගනු ලැබිය යුතු ය.

5.2 ප්‍රශ්නගත ගනුදෙනු හේතුවෙන් සිදුවූ මුදල් ආපසු ලබාදීම් හෝ වෙනස් කිරීම්ද ඇතුළුව ගනුදෙනුවක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ මුදල් ආපසු ලබාදීම හේතුවෙන් සිදුවිය හැකි යම් හුවමාරු කිරීමේ අලාභයකට කාඩ්පත්හිමියා යටත්විය යුතු ය.

5.3 නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයට මාසික ප්‍රකාශ යවන ලෙස කාඩ්පත්හිමියා විසින් කරන ලද ඉල්ලීම පිළිගැනීමට බැංකුව විසින් එකඟවීමට ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, කාඩ්පත්හිමියා විසින්, බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික ප්‍රකාශ සේවාව මගින් හෝ වෙනත් යම් සම්ප්‍රේෂණ මාර්ගයක් මගින් තමා වෙත යවනු ලබන සියලු ප්‍රකාශ තමා විසින් සත්‍ය බවට ද නිවැරදිබවට ද පිළිගන්නා බවට සහ භාරගන්නා බවට එකඟවනු ලැබේ. තමා විසින් එසේ එකඟ වූ පසු, තමා විසින් බැංකුවට එරෙහිව කිසිදු විරෝධතාවක් ඉදිරිපත් නොකරන බවට ද, බැංකුව විසින් විද්‍යුත් තැපැල් මාර්ගයෙන් සම්ප්‍රේෂණය කරනු ලබන ප්‍රකාශ සම්බන්ධයෙන් වන අවදානම සහ වගකීම තමා විසින් සම්පූර්ණයෙන් භාරගන්නා බවටද කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ. අන්තර්ජාලය මගින් සම්ප්‍රේෂණය කිරීමේදී විද්‍යුත් තැපැල් පණිවුඩවල

රහස්‍යභාවයට සහ/හෝ ආරක්ෂාවට බලපාන බාහිර සාධක සඳහා බැංකුව විසින් වගකියනු නොලබන බවට කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ; පිළිගනු ලැබේ. බැංකුව විසින් එසේ කාඩ්පත්හිමියාගේ ඉල්ලීම පිළිගෙන විද්‍යුත් තැපැල් මාර්ගයෙන් ප්‍රකාශ සහ තොරතුරු සම්ප්‍රේෂණය කිරීම තුළින් ජනිත වන හෝ ඊට අදාළ සියලු නඩුකර, නඩු කටයුතු, වගකීම් සහ හිමිකම්පෑම්, නඩු, අලාභහානි, ගාස්තු සහ වියදම් සඳහා බැංකුව හානි පූරණය කිරීමට ද කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ.

5..4 කාඩ්පත්හිමියා විසින්, සේවාව සම්බන්ධයෙන් කලින් කල බැංකුව විසින් පනවනු ලැබිය හැකි සියලු ගාස්තු සහ අයකිරීම් බැංකුව විසින් නියම කරනු ලබන ආකාරයෙන් ගෙවනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා වෙත දැනුම්දීමක් කර කලින් කල යම් සේවාවක් එකතු කිරීමට, නතර කිරීමට හෝ වෙනස් කිරීමට ද කාඩ්පත්හිමියා විසින් බැංකුවට බලය දෙනු ලැබේ. කාඩ්පත්හිමියා විසින්, විද්‍යුත් තැපැල් ලිපිනයේ සිදුවන යම් වෙනසක් හෝ මේ පහසුකම නතර කිරීම සඳහා වන යම් ඉල්ලීමක් කාඩ්පත්, කාඩ්පත් මධ්‍යස්ථානය, අංක 40, නවම් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලිඛිතව දන්වනු ලැබිය යුතු ය. එසේ ලබාදුන් දත්ත දූෂණය හෝ තොරතුරු ප්‍රමාදවීම සහ/හෝ සම්ප්‍රේෂණය නැවැත්වීම සම්බන්ධයෙන් බැංකුව වගවනු හෝ වගකියනු නොලබන බවට ද, කලින් කල සහ ඕනෑම විටකදී එම තොරතුරු යාවත්කාලීන කිරීමේ සහ වෙනස් කිරීමේ අයිතිවාසිකම බැංකුව සතුවන බවට ද කාඩ්පත්හිමියා විසින් වැඩිදුරටත් ප්‍රකාශිතවම එකඟවනු සහ පිළිගනු ලැබේ. කාඩ්පත්හිමියා විසින්, ඉහත කී විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රචාරන සහ ප්‍රවර්ධන තොරතුරු යැවීමට ද බැංකුවට බලය දෙනු ලැබේ.

5.5 අවස්ථාවෝචිත පරිදි, විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන හෝ ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදල්වලට නැවත පරිවර්තනය කරන යම් අවස්ථාවක අදාළ කරගනු ලබන විනිමය අනුපාත හෝ ප්‍රතිවිනිමය අනුපාත තමා සහ බැංකුව අතර අවසානාත්මක සහ තීරණාත්මක ලෙස ක්‍රියාත්මක වන බව කාඩ්පත්හිමියා විසින් පිළිගනු ලබන්නේ ය. ගෙවීම් සිදු කරන ව්‍යවහාර මුදල් වර්ගය සහ ගිණුමේ ව්‍යවහාර මුදල් වර්ගය කුමක් වුවද, කාඩ්පත්හිමියා අවසාන වශයෙන් බැංකුවට ශ්‍රී ලංකා රුපියල්වලින් වගකිව යුතු ය.

5.6 සියලු පරිවර්තනය කිරීම් සහ නැවත පරිවර්තනය කිරීම් බැංකුවට යම් හුවමාරු කිරීමේ අලාභයක් සිදුවීමෙන් තොරව විය යුතු අතර, එකී සියලු හුවමාරු කිරීමේ අලාභ සම්බන්ධයෙන් බැංකුව හානිපූරණය කිරීමට කාඩ්පත්හිමියා විසින් මෙයින් ප්‍රතිඥා දෙනු ලැබේ. ''හුවමාරු කිරීමේ අලාභ'' යන්නෙන්, ව්‍යවහාර මුදල්වල සිදුවන යම් උච්ඡාවචන හෝ අදාළ යම් ව්‍යවහාර මුදල් වර්ගයක් අවප්‍රමාණයවීමක් හේතුවෙන් බැංකුවට හෝ එහි අනුයෝජිතයාට හෝ නියෝජිතයන්ට දැරීමට සිදුවූ යම් අලාභයක් අදහස් වන්නේ ය.

5.7 කාඩ්පත්හිමියා මියයාමෙන් පසු ඔහුගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ නීත්‍යානුකූල නියෝජිතයන් කාඩ්පත් ගිණුමෙහි අයවිය යුතුව, ගෙවිය යුතුව සහ හිඟව පවතින සියලු මුදල් ගෙවා අවසන් කිරීමට සහ ආපසු ගෙවීමට යටත්වන බවට කාඩ්පත්හිමියා විසින් මෙයින් එකඟ වනු ලැබේ.

## 6. PIN අංකය නිකුත් කිරීම සහ කාඩ්පත සහ PIN අංකය නැතිවීම

6.1 බැංකුව විසින් කාඩ්පත පිළිගනු ලබන යම් ATM යන්ත්‍රයක දී/ POS පර්යන්තයක දී භාවිත කිරීම සඳහා කාඩ්පත්හිමියා වෙත PIN අංකයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එය තැපැල් මාර්ගයෙන් හෝ කුරියර් මාර්ගයෙන් කාඩ්පත්හිමියා වෙත යැවිය හැකි බවට ද, එහි වගකීම කාඩ්පත්හිමියා විසින් දරනු ලැබිය යුතු බවට ද කාඩ්පත්හිමියා විසින් එකඟ වනු ලැබේ.

6.2 PIN අංකය භාවිත කරමින් සිදු කරන ලද සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම කාඩ්පත්හිමියා විසින් දරනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින්, කිසිදු හේතුවක් මත වෙනත් යම් තැනැත්තකුට PIN අංකය හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

6.3 PIN අංකයක් භාවිත කරමින් සිදුකරන ලද යම් කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් බැංකුව විසින් තබන ලද සටහනෙන් කාඩ්පත්හිමියා බැඳී සිටින්නේ ය. බැංකු පද්ධතිවල ඇති තොරතුරු, කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගනුදෙනුව සඳහා අවසර දී ඇති බවට වන තීරණාත්මක සාක්ෂියක් විය යුතු අතර, කාඩ්පත්හිමියා ඉන් බැඳී සිටින්නේ ය.

6.4 කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත සහ PIN අංකය නැතිවීම හෝ සොරකම් කිරීම වැළැක්වීම පිණිස PIN අංකයේ සහ කාඩ්පතේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය.

6.5 කාඩ්පත නැතිවූ හෝ සොරකම් කරනු ලැබූ අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, නොපමාව, එම නැතිවීමට හෝ සොරකම් කිරීමට අදාළ විස්තර ද සමග ඒ පිළිබඳව දුරකතනයෙන් හෝ ෆැක්ස් මාර්ගයෙන් ඇමතුම් මධ්‍යස්ථානය වෙත සහ/හෝ එම නැතිවීම හෝ සොරකම සිදුවූ රටේ පොලිසිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. එහෙත්, එවැනි යම් අවස්ථාවකදී කාඩ්පත්හිමියා විසින්, එම දුරකතන හෝ ෆැක්ස් පණිවුඩය ලිඛිතව තහවුරු කරනු ලැබිය යුතු ය.

6.6 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කිරීම පිළිබඳ බැංකුව වෙත දැනුම් දී පසුව එය ලිඛිතව බැංකුව වෙත තහවුරු කරනු ලබන තෙක්, කාඩ්පත අනවසර ලෙස භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කාඩ්පත් ගිණුමෙන් හර කරන ලද සියලු මුදල් පිළිබඳ වගකීම කාඩ්පත්හිමියා විසින් දරනු ලැබිය යුතු ය.

6.7 කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත නැතිවීම, සොරකම් කිරීම හෝ අවභාවිත කිරීමට අදාළ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා සතු සියලු තොරතුරු බැංකුව වෙත ලබාදෙනු ලැබිය යුතු අතර, නැති වූ/සොරකම් කළ කාඩ්පත ආපසු ලබාගැනීමට සහායවීම සඳහා බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු පියවර ගනු ලැබිය යුතු ය.

6.8 බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, නැති වූ හෝ සොරකම් කළ යම් කාඩ්පතක් වෙනුවට අලුත් කාඩ්පතක් නිකුත් කිරීම හෝ මේ නියම සහ කොන්දේසිවලට යටත්ව අලුත් PIN අංකයක් නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය.

6.9 නැති වූ හෝ සොරකම් කළ කාඩ්පත කාඩ්පත්හිමියා වෙත ආපසු ලැබුණු අවස්ථාවක, ඔහු විසින්, එය භාවිත කිරීමෙන් තොරව එහි අඩක් කපා නොපමාව එය බැංකුව වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය. PIN අංකය වෙනත් යම් පාර්ශ්වයකට හෙළිදරව් කළ බව බැංකුව වෙත වාර්තා කිරීමෙන් පසු, කාඩ්පත්හිමියා විසින් එය භාවිත කරනු නොලැබිය යුතු ය.

6.10 නැති වූ කාඩ්පත් සම්බන්ධයෙන් වන විට, වෙළෙන්දන් ජාලය වෙත ඒ පිළිබඳ දැනුම්දීම සහ අලුත් කාඩ්පතක් නිකුත් කිරීම සඳහා ගතවන පරිපාලන වියදම් ආවරණය කරගැනීම සඳහා බැංකුව විසින් ගාස්තුවක් අයකරනු ලැබේ.

## 7. කාඩ්පත් ගිණුම

7.1 බැංකුව විසින්, කාඩ්පත් ගනුදෙනු, බැංකුවට අයවිය යුතු යම් ගාස්තු සහ යම් නඩු ගාස්තු සහ බැංකුව විසින් දරන ලද වෙනත් සියලු පරිපාලන වියදම් ද ඇතුළු කාඩ්පත්හිමියාගේ වෙනත් යම් බැරකම් සහ කාඩ්පත භාවිත කිරීම මගින් ජනිත වූ සහ බැංකුවට දැරීමට සිදුවූ යම් අලාභයකට අදාළ සියලු මුදල් කාඩ්පත් ගිණුමෙන් හර කරනු ලැබිය හැකි ය. එසේ හර කරන ලද සියලු මුදල් බැංකුවට ගෙවීම සඳහා ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා එක්ව සහ වෙන් වෙන් වශයෙන් වගකීම දරනු ලැබිය යුතු ය.

7.2 බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් යවනු ලැබිය යුතු අතර, කාඩ්පත්හිමියා විසින්, එම ගිණුම් ප්‍රකාශයේ සඳහන් ගෙවීම සිදුකළ යුතු දින හෝ එදිනට පෙර, යටත් පිරිසෙයින්, ගෙවිය යුතු අවම මුදල ලෙස දක්වා ඇති මුදලවත් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. එසේ වුවද, ඔහු විසින්, ස්වකීය අභිමතය පරිදි, ගෙවිය යුතු සම්පූර්ණ මුදලම හෝ ගෙවිය යුතු අවම මුදලට වැඩි යම් මුදලක් හෝ ගෙවනු ලැබිය හැකි ය.

7.3 මේ ගිවිසුම උල්ලංඝනය කිරීමක් සිදුකරනු ලැබූ අවස්ථාවක හෝ කාඩ්පත්හිමියා විසින් බුන්වත්භාවයට අදාළ යම් ක්‍රියාවක් සිදුකරනු ලැබූ අවස්ථාවක හෝ ප්‍රාථමික කාඩ්පත්හිමියා මියගිය අවස්ථාවක, බැංකුවේ පරම අභිමතය පරිදි මේ ගිවිසුම යටතේ අයවිය යුතු සියලු මුදල්, යම් ව්‍යවස්ථාවකින් පනවන ලද යම් සීමාවකට යටත්ව, නොපමාව සම්පූර්ණයෙන්ම ගෙවනු ලැබිය යුතු ය.

7.4 බැංකුවට කරනු ලබන යම් ගෙවීමක්, බැංකුව විසින් භාරගෙන කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබූ විට පමණක් බලාත්මක විය යුතු ය. ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින්, මේ ගිවිසුම යටතේ කාඩ්පත්හිමියාගේ බැඳියාවන්

ඉටුකිරීම සඳහා ලබාදුන් යම් චෙක්පතකට ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ඇති බවට වගබලාගනු ලැබිය යුතු ය.

## 8. මුදල් අත්තිකාරම්

8.1 කාඩ්පත්හිමියා විසින්, ප්‍රමාණවත් ණය මුදලක් තිබීමට සහ විදේශ විනිමය පනතට සහ නියෝගවලට යටත්ව, ණය සීමාවේ යම් උපරිම ප්‍රතිශතයක් (බැංකුව විසින් නියම කරනු ලබන පරිදි වූ) දක්වා මුදල් අත්තිකාරම් ලබාගනු ලැබිය හැකි ය.

8.2 බැංකුවේ යම් ATM යන්ත්‍රයකදී හෝ එකී බැංකුවේ හෝ ආයතනයේ ATM යන්ත්‍රය භාවිත කිරීම සඳහා බැංකුව විසින් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් බැංකුවක් හෝ ආයතනයක් සමගද, එම බැංකුවේ හෝ ආයතනයේ යම් ATM යන්ත්‍රයකදී කාඩ්පත සහ PIN අංකය භාවිත කිරීමෙන් මුදල් අත්තිකාරම් ලබාගත හැකි ය. වෙනත් බැංකු/ ආයතනවල ATM යන්ත්‍ර සම්බන්ධයෙන් වන විට, එක් එක් මුදල් අත්තිකාරම් මුදල, අදාළ ATM යන්ත්‍රයේ අදාළ දෛනික මුදල් ආපසු ලබාගැනීමේ සීමාවට අමතරව විය යුතු ය.

8.3 ATM යන්ත්‍රයේ, බැංකුවේ, වෙළෙන්දාගේ, අනුයෝජිතයාගේ ප්‍රාදේශීය හෝ දේශීය සීමා සහ පරිසීමා, විදේශ විනිමය නියෝග සහ/හෝ කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියාමන අධිකාරිවල පරිසීමා මුදල් අත්තිකරම් සඳහා අදාළ විය යුතු ය.

8.4 කාඩ්පත්හිමියා විසින් මුදල් අත්තිකාරමක් ලබාගැනීම සඳහා කාඩ්පත භාවිත කිරීම මගින්, කලින් කල බැංකුව විසින් නියම කරනු ලබන පරිදි මුදල් අත්තිකාරම් මුදල සඳහා වූ මුදල් ගාස්තුවක්, පොලියක් සහ අයකිරීමක් ගෙවීමට කාඩ්පත්හිමියා විසින් එකඟවූ බව සංස්ථාපනය වන ලෙස සලකනු ලැබිය යුතු ය. මුදල් අත්තිකාරම ලබාගත් දින සිට එය සම්පූර්ණයෙන් ආපසු ගෙවනු ලබන තෙක් එක් එක් මුදල් අත්තිකාරම සඳහා මුදල් ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් ගෙවිය යුතු මුදල් ගාස්තුවට අදාළ මුදල බැංකුව විසින් කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

8.5 විදේශ ව්‍යවහාර මුදල්වලින් මුදල් අත්තිකාරමක් ලබාගැනීම සඳහා කරනු ලැබූ යම් මුදල් ආපසු ලබාගැනීමක් සම්බන්ධයෙන් වන විට, කාඩ්පත්හිමියා විසින්, එම විදේශ ව්‍යවහාර මුදල් විදේශ විනිමය දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් විසින් අවසර දෙන ලද ගනුදෙනු සඳහා භාවිත කර ඇති බවට වූ සාක්ෂි තබාගනු ලැබිය යුතු ය.

## 9. අතිරේක කාඩ්පත

9.1 බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා හෝ අතිරේක කාඩ්පත්හිමියන් විසින් එක්ව කරනු ලබන ඉල්ලීමක් මත, ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් නම් කරන ලද තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා අතිරේක කාඩ්පතක් හෝ අතිරේක කාඩ්පත් අනුමත කර නිකුත් කරනු ලැබිය හැකිය. අතිරේක කාඩ්පත්හිමියා හෝ අතිරේක කාඩ්පත්හිමියන් වයස අවුරුදු 18ක් හෝ ඊට වැඩි තැනැත්තකුද, ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ පවුලේ සමීපතම සාමාජිකයකු හෝ සාමාජිකයන්ද (කලත්‍රයා, දරුවා, මව හෝ පියා, සහෝදරයා හෝ සහෝදරිය) විය යුතු ය. කෙළින්ම ප්‍රාථමික කාඩ්පත්හිමියාගේ යැපෙන්නන් වන ශිෂ්‍යයන් අධ්‍යාපනික කාර්ය සඳහා පමණක් අතිරේක කාඩ්පතක් ලබා ගැනීම සඳහා හිමිකම් ලැබිය යුතු අතර එම තැනැත්තා හෝ තැනැත්තන් මේ ගිවිසුමේ නියම සහ කොන්දේසිවලින් බැඳී සිටින්නේ ය.

9.2 ප්‍රාථමික කාඩ්පත්හිමියාට ලබා දී ඇති ණය සීමාවට අතිරේක කාඩ්පත්හිමියාගේ ණය සීමාව ද ඇතුළත් වන අතර, ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා විසින්, තමන්ගේ කාඩ්පත් මගින් දරනු ලබන මුළු වියදම එකී ණය සීමාව ඉක්මවා සිදු කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

9.3 අතිරේක කාඩ්පතේ වලංගුභාවය ප්‍රාථමික කාඩ්පතේ වලංගුභාවය මත රඳා පවතින අතර, අතිරේක කාඩ්පත අවසන් කිරීම මගින් ප්‍රාථමික කාඩ්පත අවසන් කිරීමක් සිදු නොවන්නේ ය.

9.4 ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා අතර එකිනෙකාට එරෙහිව තිබිය හැකි යම් ආරාවුලක් හෝ ප්‍රතියාචනයක් මගින්, ප්‍රාථමික කාඩ්පත්හිමියාට සහ අතිරේක කාඩ්පත්හිමියාට බැංකුව විෂයයෙහි ඇති වගකීම්, බැරකම් සහ බැඳියාවන්ට සහ මෙහි සඳහන් බැංකුවේ අයිතිවාසිකම්වලට කිසිදු ආකාරයකින් බලපෑමක් නොවිය යුතු ය.

9.5 ස්වකීය කාඩ්පත් ගිණුම් ඒකාබද්ධ වුවද, වෙන වෙනම වුවද, කාඩ්පත හෝ කාඩ්පත් භාවිත කිරීමෙන් සකස් කරන ලද සියලු කාඩ්පත් ගනුදෙනු සඳහා ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා හෝ අතිරේක කාඩ්පත්හිමියන් යන දෙපාර්ශ්වයම එක්ව සහ වෙන් වෙන් වශයෙන් වගකීම දරනු ලැබිය යුතු ය.

9.6 ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින්, අතිරේක කාඩ්පතින් අඩක් කපා, එය ද සමග බැංකුව වෙත ලිඛිත දැනුම්දීමක් කිරීම මගින් අතිරේක කාඩ්පත්හිමියාගේ හෝ අතිරේක කාඩ්පත්හිමියන්ගේ බලය අවලංගු කරනු ලැබිය හැකි ය.

9.7 ඉහත 9.6හි සඳහන් අවලංගු කිරීමේ දිනට පෙරාතුව අතිරේක කාඩ්පත්හිමියා විසින් අවසර දෙන ලද සියලු කාඩ්පත් ගනුදෙනු වලංගු වන්නේ ය. තවද, එම ගනුදෙනුවලින් කාඩ්පත්හිමියා බැඳී සිටින අතර, ඒවා කාඩ්පත්හිමියාගේ වගකීම වන්නේ ය.

9.8 ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින්, අතිරේක කාඩ්පත්හිමියාගේ යම් නෛතික නොහැකියාවක් හෝ අශක්නුතාවක් හේතුවෙන් හෝ අතිරේක කාඩ්පත්හිමියා විසින් සිදුකරන ලද මේ නියම සහ කොන්දේසි උල්ලංඝනය කිරීමක් හේතුවෙන් බැංකුවට දැරීමට සිදුවූ යම් පාඩුවක්, අලාභයක්, බැරකමක් සහ නඩු ගාස්තු හෝ අන්‍යාකාරයකින් වන වියදම් සඳහා බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

## 10. කාඩ්පත පිළිගැනීම

10.1 කාඩ්පත් පිළිගන්නා බව නිෂ්පාදන සලකුණ මගින් ප්‍රදර්ශනය කරන වෙළඳ ආයතන සහ මූල්‍ය ආයතනවලදී කාඩ්පත පිළිගනු ලැබෙන්නේ ය. බැංකුව

විසින්, යම් වෙළෙඳ/ මූල්‍ය ආයතනයක් විසින් කවර වූ හෝ හේතුවක් මත කාඩ්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් වගකියනු හෝ වගවනු නොලැබෙන්නේ ය. යම් පරිශ්‍රයක ප්‍රදර්ශනය කර ඇති කාඩ්පත් ප්‍රවර්ධන තොරතුරු හෝ නිෂ්පාදන සලකුණු එම පරිශ්‍රයේ ඇති සියලු භාණ්ඩ සහ සේවා කාඩ්පත මගින් මිලදී ගත හැකි බවට වූ සහතිකයක් නොවන්නේ ය.

10.2 ඉන්ධන පිරවුම්හල් හෝ ඉන්ධන පිරවුම් ස්ථානවලින් පෙට්‍රල්, ඩීසල් සහ ගෑස් වැනි භාණ්ඩ මිලදී ගැනීම අදාළ හැසිරවීමේ ගාස්තුවලට සහ සේවා ගාස්තුවලට යටත් වන්නේ ය.

10.3 එසේ වුවද, කාඩ්පත්හිමියා විසින්, ගනුදෙනුවට අදාළ ස්ථානයේ නම, දිනය සහ වේලාව සහ බැංකුවට ස්වකීය විමර්ශනවලදී සහාය වන වෙනත් තොරතුරු දක්වමින්, යම් වෙළෙන්දකු/බැංකුවක් විසින් කාඩ්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමක් පිළිබඳව බැංකුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

## 11. ගිණුම් ප්‍රකාශය

11.1 ගිණුම් ප්‍රකාශය තුළ, පෙර ගිණුම් ප්‍රකාශයේ දින සිට වර්තමාන ගිණුම් ප්‍රකාශයේ දිනයේ දී ව්‍යාපාර කටයුතු අවසන් කිරීම දක්වා කාඩ්පත් ගිණුමට අදාළව ලැබී සැකසුම් කරන ලද සියලු කාඩ්පත් ගනුදෙනු දැක්වෙනු ලැබිය යුතු ය.

11.2 ගිණුම් ප්‍රකාශය තුළ දැක්වෙන ගෙවිය යුතු මුදල පහත දැක්වෙන දේවල්වලින් සමන්විත විය යුතුය; එනම්:-

11.2.1 කාඩ්පත්හිමියා හෝ යම් අතිරේක කාඩ්පත්හිමියකු හෝ අතිරේක කාඩ්පත්හිමියන් විසින් කාඩ්පත් ගිණුමෙන් අයකර ගැනීම සඳහා අවසර දෙන ලද සියලු විද්‍යුත් තැපැල්, අන්තර්ජාල ගනුදෙනු සහ දුරකථන ඇණවුම් ද ඇතුළුව කාඩ්පත භාවිත කිරීමෙන් මිලදීගත් සියලු භාණ්ඩ සහ සේවාවල මිල.

11.2.2 අදාළ විටදී, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) මාර්ගයෙන් ලබාගත් මුදල් අත්තිකාරම් ද ඇතුළුව කාඩ්පත් ගිණුමට අදාළව ලබාගත් මුදල් අත්තිකාරම්.

11.2.3 දැනට පවත්නා රජයේ බදු සහ ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කිරීමෙන් ජනිත වූ වෙනත් සියලු බැංකු ගාස්තු සහ ඒ මත වන පොලිය ද ඇතුළුව මෙහි 12 වන වගන්තිය (ගෙවීම් සහ ගාස්තු) යටතේ දක්වා ඇති ගාස්තු (උදා: අයකිරීම්, සේවා ගාස්තු ආදිය)

11.3 බැංකුව විසින්, සෑම මසකම කලින් නියම කරගත් දිනයකදී කාඩ්පත් ගිණුමට අදාළ කාඩ්පත් ගනුදෙනු ඇතුළත් ප්‍රකාශයක් විද්‍යුත් තැපැල් මාර්ගයෙන් කාඩ්පත්හිමියා වෙත යවනු ලැබිය යුතු ය. කිසිදු හිග ශේෂයක් නොමැති සහ පෙර ප්‍රකාශයේ දින සිට බැංකුව වෙත කිසිදු කාඩ්පත් ගනුදෙනුවක් ලැබී නොමැති අවස්ථාවක, කිසිදු ගිණුම් ප්‍රකාශයක් නිකුත් කරනු නොලැබෙන්නේ ය.

11.4 කවර වූ හෝ හේතුවක් මත ගිණුම් ප්‍රකාශය නොලැබීම, ගෙවිය යුතු මුදල් නියමිත වේලාවට නොගෙවීම සඳහා වලංගු හේතුවක් නොවිය යුතු ය. සාමාන්‍යයෙන් ගිණුම් ප්‍රකාශය ලැබෙන දින සිට දින 10ක් ඇතුළත කාඩ්පත්හිමියා වෙත ගිණුම් ප්‍රකාශය නොලැබුණු අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, ගෙවිය යුතු මුදල පරීක්ෂා කර බැලීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානය වෙත දුරකතන ඇමතුමක් ලබා දෙනු ලැබිය යුතු ය. පුරෝකතනය කළ නොහැකි අවස්ථානුගත කරුණු සහ බැංකුවේ පාලනයෙන් තොර අවස්ථානුගත කරුණු හේතුවෙන් ගිණුම් ප්‍රකාශය නොලැබීම සම්බන්ධයෙන් බැංකුව විසින් වගකීම දරනු නොලැබෙන්නේ ය.

11.5 කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද එක් එක් ගිණුම් ප්‍රකාශය පරීක්ෂා කර, එම ගිණුම් ප්‍රකාශයේ දින සිට දින 14ක් ඇතුළත, එහි ඇතැයි කියනු ලබන යම් දෝෂයක් පිළිබඳව බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. එකී දින 14 කාලසීමාව ඇතුළත එම ගිණුම් ප්‍රකාශයේ ඇතැයි කියනු ලබන එවැනි යම් දෝෂයක් පිළිබඳව බැංකුව වෙත දැනුම්දීම කාඩ්පත්හිමියා විසින් පැහැර හැරිනු ලැබූ

අවස්ථාවක, ගිණුම් ප්‍රකාශයෙන් සහ එහි සියලු සටහන්වලින් කාඩ්පත්හිමියා බැඳී සිටිනු ලැබිය යුතු අතර, එය එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය. තවද, කාඩ්පත්හිමියා විසින්, ඉන්පසු, ගිණුම් ප්‍රකාශයේ අන්තර්ගත කරුණු අභියෝගයට ලක් කරනු නොලැබිය යුතු ය. සියලු ගිණුම් ප්‍රකාශ ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත ලිඛිතව ලබාදුන් නවතම ලිපිනයට ඉලෙක්ට්‍රොනිකව යවනු ලැබෙන්නේය. කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් වන යම් පැමිණිල්ලක් 011 244 88 88 යන දුරකතන අංකය මගින් හෝ කලින් කල බැංකුව විසින් නම් කර ස්වකීය නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන වෙනත් යම් දුරකතන අංකයක් මගින් ඇමතුම් මධ්‍යස්ථානය වෙත සන්නිවේදනය කරනු ලැබිය හැකි ය.

11.6 කාඩ්පත්හිමියා විසින් යම් ගිණුම් ප්‍රකාශයකට අදාළව බැංකුව වෙත යම් මුදලක් ගෙවීම, ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන සටහන් කාඩ්පත්හිමියා විසින් පිළිගත් බවට වූ බන්ධනීය සහ තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

**12. (අ) ගෙවීම් සහ ගාස්තු**

12.1 මේ වගන්තියේ සඳහන් දැනට පවත්නා සියලු ගාස්තු සහ අයකිරීම් පිළිබඳ විස්තර බැංකුවේ නිල වෙබ් අඩවියේ (www.ndbbank.com) දැක්වෙන සාමාන්‍ය ගාස්තු ග්‍රන්ථිකාව ප්‍රකාර බැංකුව විසින් පළ කරන ලද සේවා සහ මිල ගණන් පිළිබඳ මාර්ගෝපදේශයේ දක්වා ඇති අතර, එහි පිටපත් ඉල්ලීමක් කිරීමෙන් ලබාගත හැකි ය. මේ ගාස්තු, පූර්ව දැනුම්දීමක් කරමින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය.

12.2 බැංකුව විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත සහ අතිරේක කාඩ්පත නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ඒ සඳහා බැංකුව විසින් නියම කරනු ලබන බැඳීමේ ගාස්තුවක් සහ වාර්ෂික ගාස්තුවක් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. කාඩ්පත අවසන් කරනු ලැබූ හෝ පිළිගනු නොලැබූ අවස්ථාවක වාර්ෂික ගාස්තුව ආපසු ලබාදෙනු නොලැබෙන්නේ ය.

12.2.1 බැංකුව විසින් ජීවිත කාලය පුරාවටම නොමිලේ සපයනු ලබන දීමනාවක් ප්‍රදානය කර ඇති අවස්ථාවක, කාඩ්පත සක්‍රීයව පවතින සහ කාඩ්පත් ගනුදෙනු සඳහා කාඩ්පත භාවිත කරන තාක් කල් එම දීමනාව වලංගුව පවතින්නේ ය. කාඩ්පත එය නිකුත් කරනු ලැබූ දින සිට හෝ වෙනත් යම් පසුව එළඹෙන කාලසීමාවක සිට මාස තුනකට (03) වැඩි කාලසීමාවක් දිගටම අක්‍රීයව පවතින්නේ නම්, ස්වකීය පරම අභිමතය පරිදි, එකී ජීවිත කාලය පුරාවටම නොමිලේ සපයනු ලබන දීමනාව ඉවත් කර දැනට පවත්නා ගාස්තුවලට අනුව අදාළ වාර්ෂික ගාස්තු ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ. එසේ වාර්ෂික ගාස්තු ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් පසු, විරෝධතාවක් දැක්වීමෙන් තොරව අදාළ වාර්ෂික ගාස්තු ගෙවීමට කාඩ්පත්හිමියා යටත් විය යුතු ය.

12.3 කාඩ්පත්හිමියා විසින්, ගිණුම් ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති දිනයට පසු නොවන දිනයක දී සම්පූර්ණයෙන් අයවිය යුතු සහ ගෙවිය යුතු සහ ගිණුම් ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති දැනට පවත්නා ශේෂය ලෙස විස්තර කර ඇති සියලු ගාස්තුවලට අදාළ මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලැබිය යුතු අතර, ගෙවීම සිදුකළ යුතු දින හෝ එදිනට පෙර දැනට පවත්නා ශේෂයට අදාළ ගෙවීම බැංකුව වෙත ලැබී ඇති අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින් කිසිදු මුදල් ගාස්තුවක් (මුදල් අත්තිකාරම් හැර) ගෙවිය යුතු නොවන්නේ ය.

12.4 ගෙවීම සිදුකළ යුතු දිනය වන විට කාඩ්පත්හිමියා විසින් ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන ගෙවිය යුතු මුලු මුදල ගෙවා අවසන් කර නොමැති අවස්ථාවක, බැංකුවේ නිල වෙබ් අඩවියේ (www.ndbbank.com) දැක්වෙන ගාස්තුවල නිශ්චිතව දක්වා ඇති පරිදි හෝ බැංකුව විසින් ලිඛිතව දන්වනු ලබන පරිදි බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයන් මත පොලී අයකරනු ලැබෙන්නේ ය. ගනුදෙනුව යැවූ දින සිට දෛනික පදනමින් පොලිය ගණනය කරනු ලබන අතර, ඉදිරියට ගෙන ආ යම් ශේෂයක් මත වත්මන් ගිණුම් ප්‍රකාශය අදාළ වන මාසයේ පළමුවන දින සිට ඊළඟ ගිණුම් ප්‍රකාශයේ දින දක්වා පොලියක් අය කරනු ලැබේ. පොලිය ගණනය කිරීමේ

ක්‍රමය පිළිබඳ වූ නිදර්ශනයක් අවශ්‍යනම්, කාඩ්පත්හිමියා විසින්, ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශය බලනු ලැබිය හැකි ය.

12.5 කාඩ්පත් ගිණුම ආරම්භ කිරීමෙන් පසු කාඩ්පත්හිමියා වෙත ලැබෙන පළමුවන ගිණුම් ප්‍රකාශයෙහි, කාඩ්පත් ගිණුම ආරම්භ කළ දින සිට ගිණුම් ප්‍රකාශය සකස්කළ දින දක්වා සිදුකළ ගනුදෙනු සහ ගෙවිය යුතු ගාස්තු පිළිබඳ විස්තර ඇතුළත් වන්නේ ය. මුදල් අත්තිකාරමක් ලබාගෙන නොමැති නම් මෙම ගිණුම් ප්‍රකාශයෙහි කිසිදු පොලී මුදලක් නොදැක්වෙන අතර, මුදල් අත්තිකාරමක් ලබාගෙන ඇත්නම් පමණක් පොලියක් අය කරනු ලැබන්නේ ය. ගෙවීම සිදුකළ යුතු දින හෝ එදිනට පෙර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලැබූ අවස්ථාවක කිසිදු පොලියක් අය කරනු නොලැබෙන්නේ ය.

12.6 එමනිසා, ගිණුම් ප්‍රකාශයෙහි දැක්වෙන මුදල සම්පූර්ණයෙන් ගෙවන කාඩ්පත්හිමියකු/තම ගනුදෙනු සඳහා (මුදල් අත්තිකාරම් සඳහා හැර) පොලියක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

12.7 මුදල් අත්තිකාරම් ලබාගත් දින සිට එය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන දින තෙක් එම මුදල් අත්තිකාරම මත පොලී අය කරනු ලැබෙන්නේ ය.

12.8 ගෙවීම සිදුකළ යුතු දින හෝ එදිනට පෙර ගෙවිය යුතු අවම මුදල ගෙවා අවසන් කරනු නොලැබූ අවස්ථාවක, පොලියට අමතරව, කලින් කල නියම කරනු ලබන ප්‍රමාද ගාස්තුවක් ගෙවීමටද කාඩ්පත්හිමියා යටත් විය යුතු ය.

12.9 අදාළ විටදී, බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ මත ගාස්තු සහ අයකිරීම් බැංකුවට ගෙවීමට ද කාඩ්පත්හිමියා විසින් එකඟ වනු ලැබේ.

12.10 ගෙවීම සිදුකළ යුතු දින වන විට කාඩ්පත්හිමියා විසින් දැනට පවත්නා ශේෂය ගෙවා අවසන් කරනු නොලැබූ අවස්ථාවක, ගෙවිය යුතු මුදල් කාඩ්පත් ගිණුමට බැරකරනු ලබන තෙක් දැනට පවත්නා ශේෂය මත

දෛනික පදනමින් ගණනය කරනු ලබන මුදල් ගාස්තුවක් අයකරනු ලබන අතර, ඉන්පසු ඉතිරි ශේෂය මත එවැනි මුදල් ගාස්තුවක් අය කරනු ලැබේ.

12.11 කාඩ්පත්හිමියාගෙන් බැංකුවට ලැබෙන සියලු ගෙවුම් මුදල් පහත දැක්වෙන ගෙවීම් අනුපිළිවෙලට හෝ බැංකුව විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ප්‍රමුඛතා අනුපිළිවෙළකට අනුව භාවිත කරනු ලැබිය හැකිය:-

12.11.1 පෙර ගිණුම් ප්‍රකාශයක දැක්වෙන සියලු නොගෙවූ මුදල් ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම් සහ වෙනත් වියදම්,

12.11.2 වත්මන් ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන සියලු නොගෙවූ මුදල් ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම් සහ වෙනත් වියදම්.

12.11.3 පෙර ගිණුම් ප්‍රකාශයක දැක්වෙන සියලු නොගෙවූ කාඩ්පත් ගනුදෙනු සහ මිලදීගැනීමේ ගනුදෙනු.

12.11.4 වත්මන් ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන සියලු නොගෙවූ කාඩ්පත් ගනුදෙනු සහ මිලදීගැනීමේ ගනුදෙනු.

12.11.5 වත්මන් ගිණුම් ප්‍රකාශයේ තවමත් නොදැක්වෙන සියලු මුදල් ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම්, වෙනත් වියදම් සහ කාඩ්පත් ගනුදෙනු.

12.12 ස්වකීය පරම අභිමතය පරිදි වාර්ෂික ගාස්තු, හැසිරවීමේ ගාස්තු, අතිරේක ගාස්තු, මුදල් ගාස්තු, නිශ්චිතව දක්වා ඇති ගෙවිය යුතු අවම මුදල සහ/හෝ ප්‍රමාද ගාස්තු හෝ වෙනත් යම් ගාස්තු සම්බන්ධයෙන් වන අනුප්‍රමාණය, ක්‍රමය හෝ ගණනය කිරීම වෙනස් කිරීමට බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

12.13 තිබෙන කාඩ්පත වෙනුවට අලුත් කාඩ්පතක් නිකුත් කිරීම සඳහා බැංකුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, කාඩ්පත්හිමියා විසින්, නොපමාව, බැංකුව

විසින් නියම කරනු ලබන පරිදි තිබෙන කාඩ්පත වෙනුවට අලුත් කාඩ්පතක් නිකුත් කිරීමේ ගාස්තුවක් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය.

12.14 ඕනෑම විටකදී අවශ්‍ය නෛතික පියවර ගැනීමට බැංකුවට ඇති අයිතිවාසිකම්වලට අගතියක් නොමැතිව, හිඟ මුදල සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ගෙවීම සඳහා කාඩ්පත්හිමියා විසින් ලියන ලද යම් අගරු චෙක්පතක් සඳහා බැංකුව විසින් ගාස්තු අය කරනු ලැබිය හැකි ය.

12.15 යම් අවස්ථාවක දී කාඩ්පත් ගිණුම යටතේ කාඩ්පත්හිමියාගෙන් බැංකුවට යම් මුදලක් අයවිය යුතුවන හෝ ජංගම නැතහොත් අන්‍යාකාරයකින් වන යම් බැංකු ගිණුමක් හෝ වෙනත් යම් ගිණුමක් සඳහා කාඩ්පත්හිමියා යම් ආකාරයකින් බැංකුවට වගකිව යුතු වන හෝ එම ගිණුම්වලට හෝ බැංකුව විසින් කාඩ්පත්හිමියාට ලබා දී ඇති වෙනත් යම් බැංකු පහසුකම්වලට අදාළ මුදල් ගෙවීම කාඩ්පත්හිමියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සහ එවැනි විටෙක, කාඩ්පත් ගිණුමේ හෝ ගිණුම්වල ගෙවිය යුතු මුලු ශේෂය නොපමාව අයවිය යුතු වන සහ ගෙවිය යුතු වන බවට ද, මෙහි 18 වන වගන්තියේ (අවසන් කිරීම) විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට ද කාඩ්පත්හිමියා විසින් මෙයින් ප්‍රකාශිතවම එකඟවනු ලැබේ.

12.16 බැංකුවේ නිලධරයකු විසින් අත්සන් කරන ලද කාඩ්පත් ගිණුමේ ශේෂය දැක්වෙන සහතිකයක්, එම සහතිකයේ දිනට කාඩ්පත්හිමියා විසින් බැංකුවට ගෙවිය යුතු ණය මුදල පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

12.17 යම් මුදල් තැන්පතුවක් කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබූ විටදී පමණක් එය බැංකුව වෙත ලැබුණු ලෙස සලකනු ලැබිය හැකි ය.

12.18 චෙක්පත් තැන්පතුවක් රැස් කර ගැනීම සඳහා පිළිගනු ලැබිය හැකි අතර, එම චෙක්පත නිෂ්කාශනය කර එහි මුදල් බැංකුවට ගෙවනු ලබන තෙක් එම මුදල් ලබාගත නොහැකි ය. බැංකුවේ චෙක්පත් තැන්පතු පෙට්ටිවල ඇති චෙක්පත් තැන්පතු ඊළඟ වැඩ කරන දිනයේ දී රැස් කර ගනු ලැබෙන්නේ ය.

12.19 කාඩ්පත්හිමියා විසින්, ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන ගෙවිය යුතු මුදලින් යම් ප්‍රතිශතයක් ගෙවීම සිදුකළ යුතු දිනයේදී කාඩ්පත් ගිණුමට ගෙවීම සඳහා බැංකුවේ ඇති තම ජංගම හෝ ඉතුරුම් ගිණුමට සෘජු හර කිරීමේ ස්ථාවර නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය. එවැනි යම් ස්ථාවර නියෝගයකට කරනු ලබන යම් සංශෝධනයක් හෝ අවලංගු කිරීමක්, යටත් පිරිසෙයින්, ඊළඟ ගෙවීම සිදු කළ යුතු දිනට සති දෙකකට පෙරාතුවවත් බැංකුවට ලැබිය යුතු බවට කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ.

12.20 බැංකුවේ නම් කරන ලද පියවුම් ගිණුමට ලබාදෙන සෘජු හර කිරීමේ ස්ථාවර නියෝගයක් සඳහා පහත දැක්වෙන අතිරේක නියම සහ කොන්දේසි ද අදාළ විය යුතු ය:-

I. ඉදිරිපත් කළ චෙක්පත් හෝ බැංකුව සමඟ එළඹ ඇති වෙනත් යම් වැඩපිළිවෙලක් අභිබවා එවැනි යම් ස්ථාවර නියෝගයකට ප්‍රමුඛතාව ලබාදීම පිළිබඳ තීරණය කිරීමේ අයිතිය බැංකුව සතුවන බවට කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ.

II. ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීමට හැකි කරවීම සඳහා, ගෙවීම සිදුකළ යුතු දිනට පෙරාතුව වූ දිනයේ දී නම් කරන ලද පියවුම් ගිණුමට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ලබාදීමට කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ. පියවුම් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැති අවස්ථාවක, බැංකුව විසින්, ස්වකීය අභිමතය පරිදි, ස්ථාවර නියෝග ප්‍රකාර ගෙවිය යුතු මුදල අයකරගැනීම සඳහා කලින් කල අණකර නිකුත් කරනු ලැබිය හැකි ය. ඉල්ලුවිට, ගෙවිය යුතු සියලු මුදල්, ඒ මත උපචිත වූ මුදල් ගාස්තු ද ඇතුළුව ඊට අදාළ සියලු ගාස්තු, අයකිරීම් සහ අයබදු ද සමඟ, කලින් කල බැංකුව විසින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයක් මත ආපසු ගෙවීමට කාඩ්පත්හිමියා බැඳී සිටින්නේ ය.

III. බැංකුවේ නම් කරන ලද පියවුම් ගිණුමකට ලබා දුන් සෘජු ස්ථාවර නියෝග ගණනය කිරීමේ දී, ප්‍රකාශයේ දිනය සහ ගෙවීම සිදුකළ යුතු දිනය අතර වූ කාලසීමාව තුළ සිදු කරන ලද සියලු අතුරු ගෙවීම් සැලකිල්ලට ගනු නොලැබිය යුතු බවට කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ.

IV. ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් නම් කරන ලද පියවුම් ගිණුමේ නොමැති අවස්ථාවක, ගෙවීමෙන් කොටසක් සිදුකර ඇති වුව ද නැතහොත් අයකරගෙන ඇති වුවද, බැංකුව විසින්, රු. 250ක ස්වයංක්‍රීය ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමේ ගාස්තුවක් අයකරනු ලැබිය හැකි ය. එම ගාස්තුව බැංකුවේ අභිමතය පරිදි කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය. කාඩ්පත්හිමියා විසින් ලබාදෙන ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් නම් කරන ලද පියවුම් ගිණුමේ දිගටම නොමැති අවස්ථාවක, එම ස්ථාවර නියෝග අක්‍රිය කරනු ලැබෙන්නේ ය.

12.21 සාමාන්‍යයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී සත්‍ය වශයෙන්ම බැංකුව වෙත යම් ගෙවීම් ලැබෙන දිනයේ දී එම ගෙවීම් සිදුකරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

12.22 කාඩ්පත්හිමියා විසින් සිදු කරනු ලබන සියලු ගෙවීම් කාඩ්පත් ගිණුමේ බිල්පත් යැවීමේ ව්‍යවහාර මුදල් වර්ගයෙන් විය යුතු ය. වෙනත් යම් ව්‍යවහාර මුදල් වර්ගයකින් ගෙවීම් සිදුකරනු ලැබූ අවස්ථාවක, එම මුදල් බිල්පත් යැවීමේ ව්‍යවහාර මුදල් වර්ගයට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් අයකරනු ලැබූ හෝ දරනු ලැබූ සියලු හුවමාරු කොමිස් මුදල් සහ වෙනත් ගාස්තු හෝ අලාභ කාඩ්පත්හිමියා විසින් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. කාඩ්පත් ගිණුමට ඇතුළත් වූ දින බැංකුව විසින් තීරණාත්මක ලෙස නිශ්චය කරනු ලබන යම් විනිමය අනුපාතිකයක් අනුව එම පරිවර්තනය සිදු කරනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුමේ බිල්පත් යැවීමේ ව්‍යවහාර මුදල් වර්ගයෙන් කරනු ලබන යම් ගෙවීමක්, බැංකුව විසින්, එම මුදල් කාඩ්පත් ගිණුමට යැවූ දිනයේදී පමණක් කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, බිල්පත් යැවීමේ ව්‍යවහාර මුදල් වර්ගය

නොවන වෙනත් යම් ව්‍යවහාර මුදල් වර්ගයකින් ගෙවීම් ලැබුණු අවස්ථාවක, එම ගෙවීම් මුදල බිල්පත් යැවීමේ ව්‍යවහාර මුදල් වර්ගයට පරිවර්තනය කරනු ලැබූ දිනෙන් හෝ වටිනාකම මත අදාළ මුදල් බැංකුව වෙත ලැබී එම මුදල් කාඩ්පත් ගිණුමට යැවූ දිනෙන් පසුව එම ගෙවුම් මුදල බැර කරනු ලැබිය යුතු ය.

12.23 නීතියක් මගින් එසේ අඩුකරන ලෙස හෝ රඳවා තබා ගන්නා ලෙස නියම කර ඇත්නම් මිස, කාඩ්පත්හිමියා විසින්, මේ ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලු මුදල් යම් අඩුකිරීමකින් හෝ රඳවා තබාගැනීමකින් (හිලව් කිරීම්, ප්‍රතියාචන, බදු හෝ ගාස්තු සඳහා හෝ අන්‍යාකාරයකින් වන) තොරව සම්පූර්ණයෙන් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය. නීතියක් මගින් යම් අඩුකිරීමක් හෝ රඳවා තබාගැනීමක් කිරීමට නියම කර ඇති අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, එම අඩුකිරීම හේ රඳවා තබාගැනීම සිදුකරනු නොලැබුවේ නම් බැංකුවට ලැබිය යුතුව තිබූ සම්පූර්ණ මුදලට සමාන මුදලක් බැංකුවට ලැබීමට සැලැස්වෙන පරිදි අතිරේක මුදලක් නොපමාව බැංකුවට ගෙවනු ලැබිය යුතු අතර, කාඩ්පත්හිමියා විසින්, එසේ අඩු කරන ලද හෝ රඳවා තබාගන්නා ලද සියලු මුදල් සඳහා අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද නිල ලදුපතක් බැංකුව වෙත ලබාදෙනු ලැබිය යුතු ය.

12.24 මේ ගිවිසුමේ අනෙකුත් විධිවිධානවලට අගතියක් නොමැතිව, කාඩ්පත්හිමියා එක් මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරට යනු ලබන අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත් ගිණුම පියවීම සඳහා පැහැදිලි සහ නිශ්චිත උපදෙස් ලබා දී, ඔහු/ඇය රටින් නික්මයාමට පෙරාතුව එම උපදෙස් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් එසේ යථා පරිදි දැනුම්දීමක් කරනු නොලැබුවහොත් ස්වකීය අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ.

12.25 කාඩ්පත්හිමියා සංචාරය කරනු ලබන අවස්ථාවක හෝ තම නගරයෙන් බැහැරව සිටින අවස්ථාවක, ගෙවීම සිදුකළ යුතු දින හෝ එදිනට පෙර,

යටත් පිරිසෙයින්, ගෙවිය යුතු අවම මුදලවත් බැංකුවට ගෙවීම සහතික කිරීම සඳහා වැඩපිළිවෙල යෙදීම කාඩ්පත්හිමියාගේ වගකීම වන්නේ ය.

12.26 සාමාජික ආයතනය විසින් යථා පරිදි නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ් වවුචර්පතක් ලැබීමෙන් පසුව පමණක්, බැංකුව විසින්, යම් මුදල් ආපසු ගෙවීමකට අදාළ මුදලක් කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

**12. (ආ) වාරික ගෙවීම්**

12.27 වාරික වශයෙන් භාණ්ඩ හා සේවා මිලදීගැනීමට කාඩ්පත්හිමියා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, කාඩ්පතෙන් ලබාගත හැකි ණය මුදල එසේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවාවල මුලු වටිනාකමට සීමා කරනු ලැබෙන්නේ ය.

12.28 කාඩ්පත්හිමියා විසින් වාරික වශයෙන් භාණ්ඩ සහ සේවා මිලදී ගැනීම හෝ නැවත නැවතත් ගෙවීම් සිදුකිරීම සඳහා කාඩ්පත භාවිත කරනු ලබන අවස්ථාවක, ඉතිරි ශේෂය එසේ කිරීම සඳහා ප්‍රමාණවත් වේ නම්, එම වාරික ගෙවිය යුතුවන විට කාඩ්පත්හිමියා වෙනුවෙන් එම වාරික ගෙවීම සඳහා බැංකුවට බලයදීමට කාඩ්පත්හිමියා විසින් මෙයින් එකඟවනු ලබන අතර, එක් එක් වාරිකය ගෙවිය යුතුවන විටදී එම වාරිකය සඳහා කාඩ්පත් ගිණුමට මුදල් ගෙවීමටද කාඩ්පත්හිමියා විසින් එකඟ වනු ලැබේ.

12.29 කාඩ්පත භාවිත කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිවාසිකම අත්හිටුවනු ලැබූ හෝ කාඩ්පත් ගිණුම අවසන් කරනු ලැබූ අවස්ථාවක, බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි සහ ස්වකීය අයිතිවාසිකම් සහ ප්‍රතිකර්මවලට අගතියක් නොමැතිව, ඉතිරි වාරිකවලට අදාළ මුලු මුදලට අදාළ බිල්පත නොපමාව කාඩ්පත්හිමියා වෙත යවනු ලැබිය හැකි ය.

12.30 එම වාරික ගෙවීමේ යෝජනා ක්‍රමයට අදාළ වෙනත් යම් නිශ්චිත නියම සහ කොන්දේසිවලට යටත්වීමටද කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ. මේ ගිවිසුමේ විධිවිධාන සහ එකී නිශ්චිත නියම සහ කොන්දේසි අතර යම්

ගැටුමක් ඇති වූ අවස්ථාවක, අවශ්‍ය තාක් දුරට, කාඩ්පත්හිමියා විසින් එකී නියම සහ කොන්දේසි සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

## 13. ව්‍යවස්ථාපිත නියෝග

13.1 ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් සමාන නියාමන අධිකාරියක් විසින් කලින් කල නිකුත් කරනු ලබන සියලු නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට කාඩ්පත්හිමියා විසින් එකගවනු ලබන අතර, කාඩ්පත්හිමියා විසින්, බලාත්මකව පවතින එවැනි යම් නියෝගයකට අනුකූලව කටයුතු නොකිරීමේ හෝ එවැනි නියෝගයක් උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවට දැරීමට සිදුවූ යම් අලාභයක්, හිමිකම්පෑමක් හෝ වියදමක් සඳහා බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

13.2 කාඩ්පත්හිමියා විසින්, ප්‍රාග්ධන ගනුදෙනු සඳහා සහ වාණිජමය ප්‍රමාණවලින් පාරිභෝගික භාණ්ඩ මිලදීගැනීම/ආනයනය කිරීම සඳහා කාඩ්පත භාවිත කරනු නොලැබිය යුතු ය.

13.3 කාඩ්පත භාවිත කිරීමේදී විදේශ ව්‍යවහාර මුදල්වලින් ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කිරීම් (EFT) හෝ ATM යන්ත්‍රවලින් මුදල් ආපසුගැනීම් සිදුකිරීමට අවශ්‍ය වන අවස්ථාවක, එය විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් කලින් කල නිකුත් කරනු ලබන නියෝගවලට යටත් විය යුතු ය. තවද, එය අවසරලත් කාර්ය සඳහා පමණක් සිදුකරනු ලැබිය යුතු ය.

13.4 කාඩ්පත්හිමියා විසින් විදේශ රටකට සංක්‍රමණය වනු ලබන හෝ විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් නික්ම යනු ලබන අවස්ථාවක හෝ විදේශ විනිමය පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන කලින් කල බලපවත්නා යම් නියෝගවල දැක්වෙන අර්ථනිරූපණ ප්‍රකාර කාඩ්පත්හිමියා "අනේවාසිකයකු" ලෙස සලකනු ලබන අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, කාඩ්පත හෝ කාඩ්පත් බැංකුවට ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

13.5 බැංකුව විසින්, විදේශ විනිමය අධ්‍යක්ෂවරයා හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් විසින් කලින් කල නියම කරනු ලබන නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපවත්නා රීති සහ නියෝග යටතේ අදාළ අධිකාරී වෙත එම ගනුදෙනු පිළිබඳ හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

13.6 විදේශ විනිමය පනත හෝ එම අවලංගු කිරීම සිදුකරන ලද අවස්ථාවේදී බලපවත්නා වෙනත් යම් නීතියක් හෝ නියෝගයක් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත නියෝගයක් උල්ලංඝනය කිරීමක් සිදුව ඇතැයි විශ්වාස කිරීමට බැංකුවට කවර වූ හෝ හේතුවක් ඇති අවස්ථාවක, බැංකුව විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ, කාඩ්පත්හිමියාට දැනුම්දීමක් කිරීමෙන් තොරව කාඩ්පත අවලංගු කරනු ලැබිය හැකි ය.

**14. අයකර ගැනීම**

බැංකුව විසින්, ඕනෑම අවස්ථාවකදී, දැනුම්දීමකින් හෝ වගකීමකින් තොරව, බැංකුවේ පවත්වාගෙන යන කාඩ්පත්හිමියාගේ යම් ගිණුමක/ගිණුම්වල බැරට ඇති යම් මුදලක් කාඩ්පත් ගිණුම මත බැංකුවට අයවිය යුතු මුදල ගෙවා නිදහස් කිරීම සඳහා හිලව් කරනු හෝ පවරනු ලැබිය හැකි ය.

**15. කාඩ්පතේ වලංගු කාලසීමාව, කාලය අවසන්වීම සහ කාඩ්පත අලුත් කිරීම.**

15.1 සියලුම කාඩ්පත් සාමාන්‍යයෙන් වසර පහක වලංගු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබේ. කාඩ්පතේ දැක්වෙන කාලය අවසන්වීමේ දිනයේදී කාඩ්පතේ වලංගු කාලසීමාව අවසන් වන අතර, කාඩ්පත්හිමියා විසින් මේ ගිවිසුමේ නියම සහ කොන්දේසි උල්ලංඝනය කර ඇත්නම් මිස, බැංකුව විසින්, ස්වයංක්‍රීයවම කාඩ්පතේ (සහ අතිරේක කාඩ්පතේ) වලංගු කාලසීමාව අලුත් කර, සාමාන්‍යයෙන් වත්මන් කාඩ්පතේ හෝ කාඩ්පත්වල කාලය අවසන්වීමට දින 15කට පෙරාතුව අලුත් කාඩ්පතක් හෝ කාඩ්පත් නිකුත් කරනු ලැබිය යුතු ය. නියම කර ඇති කාලසීමාවට පෙර අලුත් කළ කාඩ්පත හෝ කාඩ්පත් නොලැබුණු අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින් ඇමතුම් මධ්‍යස්ථානයෙන් ඒ පිළිබඳ විමසනු ලැබිය යුතු ය.

15.2 එක් මාසයක් හෝ ඊට වැඩි කාලයක් තුළ යම් මුදලක් ලැබිය යුතුව නොපවතින සියලු කාඩ්පත් ස්වයංක්‍රීයවම අලුත් කරනු ලැබේ. කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පත හෝ තම අතිරේක කාඩ්පතක් අලුත් කිරීමට අකමැති අවස්ථාවක, ඔහු විසින්, ඒ සම්බන්ධයෙන් ඇමතුම් මධ්‍යස්ථානය වෙත ලිඛිත නිවේදනයක් යවනු ලැබිය යුතු ය. අලුත් කිරීමේ ගාස්තුව (අලුත් කරන අවස්ථාවේදී අදාළ වන පරිදි වූ) අයකරනු ලබන අතර, එය ආපසු ලබා දෙනු නොලැබේ.

15.3 කාඩ්පත්හිමියා විසින්, තම කාඩ්පත එහි වලංගු කාලසීමාව ඉක්මවා භාවිත කිරීමට උත්සාහ කරනු නොලැබිය යුතු ය. කාඩ්පත එහි වලංගු කාලසීමා ඉක්මවා භාවිත කිරීමට උත්සාහ කිරීමෙන් ඇතිවන යම් ප්‍රතිවිපාකයක් සඳහා බැංකුව විසින් කවර වූ හෝ ආකාරයකින් වගකීම දරනු නොලබන්නේ ය.

## 16. කාඩ්පත්හිමියා සහ වෙළෙන්දන් අතර වන ආරාවුල්

16.1 කාඩ්පත්හිමියා සහ යම් වෙළඳ ආයතනයක්/ මූල්‍ය ආයතනයක් අතර වන යම් ආරාවුලක් හෝ යම් වෙළඳ ආයතනයකට/ මූල්‍ය ආයතනයකට විරුද්ධව ඇති යම් පැමිණිල්ලක් කාඩ්පත්හිමියා විසින් එම වෙළෙඳ ආයතනය/මූල්‍ය ආයතනය සමඟ කෙළින්ම නිරාකරණය කරගනු ලැබිය යුතු ය. යම් වෙළෙඳ ආයතනයකින්/මූල්‍ය ආයතනයකින් කාඩ්පත්හිමියාට හෝ අතිරේක කාඩ්පත්හිමියාට නැතහොත් අතිරේක කාඩ්පත්හිමියන්ට ලැබුණු යම් භාණ්ඩ හෝ සේවාවල ගුණාත්මකභාවය හෝ වටිනාකම සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ආකාරයකින් වගකීම දරනු නොලබන්නේ ය.

## 17. ආරාවුල් සහ නිරාකරණය කරගැනීම්

17.1 ගිණුම් ප්‍රකාශයේ යම් වරදක් සිදුව ඇති බවට කාඩ්පත්හිමියා විශ්වාස කරන අවස්ථාවක, ඔහු විසින්, නොපමාව ඒ පිළිබඳ බැංකුව වෙත දන්වනු ලැබිය යුතු ය.

17.2 කාඩ්පත්හිමියා විසින් ඒ පිළිබඳ බැංකුව වෙත වාචිකව දැනුම් දෙනු ලැබූ අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින්, තම පැමිණිල්ල වැඩ කරන දින 5ක් ඇතුළත ලිඛිතවද යවනු ලැබිය යුතු ය. බැංකුවට යම් වැඩිදුර තොරතුරු අවශ්‍ය වන කවර වූ හෝ විටක දී, බැංකුව විසින්, කාඩ්පත්හිමියා සම්බන්ධ කරගනු ලැබිය යුතු ය.

17.3 බැංකුවේ විමර්ශනය සහ නිවැරදි කිරීම (අදාළ වේ නම්) සිදුකරමින් පවතින අතරතුර, බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, එම ආරාවුල නිරාකරණය කරගනු ලබන තෙක් ප්‍රශ්නගත මුදල ගිණුමට බැර කරනු ලැබිය හැකි ය. විමර්ශන අවසන්වීමෙන් පසු, කිසිදු වරදක් සිදුව නොමැති බවට බැංකුව විසින්, තීරණය කරනු ලැබූ අවස්ථාවක, බැංකුව විසින් නොපමාව ඒ පිළිබඳව කාඩ්පත්හිමියා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. තවද, වටිනාකම සහ දිනයද සමග ප්‍රශ්නගත මුදල කාඩ්පත්හිමියාගේ ගිණුමෙන් හර කරනු ලැබිය යුතු අතර, ඒ අනුව සේවා ගාස්තු උපචිත විය යුතු ය. කාඩ්පත්හිමියාගේ පැමිණිල්ල විමර්ශනය කිරීමේදී බැංකුවට ස්වකීය ලේඛනාගාරයෙන් හෝ වෙනත් බැංකුවක් මාර්ගයෙන් වවුචර් පිටපත් ආදිය ලබාගැනීමට සිදුවූ අවස්ථාවක, අදාළ පරිදි, එම පිටපත් ලබාගැනීමේ ගාස්තු කාඩ්පත්හිමියාගේ ගිණුමෙන් හර කරනු ලැබේ.

17.4 කාඩ්පත්හිමියා විසින්, අවශ්‍ය විස්තර/තොරතුරු ලබාදීමෙන් විමර්ශනයට සහාය වනු ලැබිය යුතු ය.

17.5 කාඩ්පත්හිමියා විසින් යම් ගනුදෙනුවක/ගනුදෙනුවල නිවැරදිභාවය පිළිබඳ ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවක, බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරනු ලැබිය යුතු ය. එසේ වුවද, කාඩ්පත්හිමියා නෛතික පියවර ගැනීමට අකමැති අවස්ථාවක හෝ විමර්ශනවලට සහායවීම සඳහා බැංකුවට නොපැමිණෙන අවස්ථාවක හෝ සී.සී.ටී.වී සහ වෙනත් සාක්ෂි නිරීක්ෂණය කිරීමට අකමැති අවස්ථාවක හෝ විමර්ශනය අතරතුර වෙළඳ ආයතන හෝ ATM යන්ත්‍ර වෙත පැමිණීමට අකමැති අවස්ථාවක, ප්‍රශ්නගත සියලු ගනුදෙනු සඳහා කාඩ්පත්හිමියා විසින් වගකීම දරනු ලැබිය යුතු බවට සලකනු ලැබිය හැකි ය.

## 18. අවසන් කිරීම

18.1 ඉහත 12 වන වගන්තිය (ගෙවීම් සහ ගාස්තු) යටතේ විස්තර කර ඇති ගෙවීම්වලට අදාළ විධිවිධානවල කුමක් සඳහන් වුවද, කාඩ්පත භාවිත කිරීම මගින් දරනු ලැබ ඇති එහෙත් තවමත් කාඩ්පත්හිමියාගේ ගිණුමට යොමු කර නොමැති මුදලද සමග කාඩ්පත් ගිණුමට (සියලු අතිරේක කාඩ්පත්වලට අදාළ මුදලද ඇතුළුව) අදාළව ගෙවිය යුතුව පවතින සියලු මුදල් මේ ගිවිසුම අවසන් කරනු ලැබූ විට වහාම සම්පූර්ණයෙන්ම අයවිය යුතු වන්නේය; ගෙවිය යුතු වන්නේ ය. මේ ගිවිසුම අවසන් කිරීම, කාඩ්පතෙන් හෝ කාඩ්පත්වලින් අඩක් කපා ඒ සමග බැංකුව වෙත ලිඛිත දැන්වීමක් කිරීම මගින් කාඩ්පත්හිමියා විසින්ද, කාඩ්පත්හිමියා මියගිය, බංකොළොත්භාවයට පත්වූ හෝ බුන්වත්භාවයට පත් වූ අවස්ථාවක හෝ බැංකුවේ පාලනයෙන් තොර යම් හේතුවක් මත කාඩ්පත්හිමියා සිටින ස්ථානය පිළිබඳ තොරතුරු දැනගැනීමට බැංකුවට නොහැකි වූ අවස්ථාවක බැංකුව විසින්ද, කරනු ලැබිය හැකි ය. කාඩ්පත්හිමියා සහ/හෝ ඔහුගේ බූදලය විසින් කාඩ්පත් ගිණුම මත ගෙවිය යුතුව ඇති යම් ශේෂයක් සම්පූර්ණයෙන් ආපසු ගෙවීම සඳහා වගකීම දරනු ලැබිය යුතු අතර, එම ගෙවිය යුතු ශේෂ ආපසු අයකර ගැනීමේදී බැංකුවට දැරීමට සිදුවූ සියලු පිරිවැය (නඩු ගාස්තු සහ අයකිරීම් ද ඇතුළුව) සහ වියදම් සඳහා බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය. එසේ එම මුදල් ආපසු ගෙවනු ලබන තෙක්, බැංකුවේ පවත්නා අනුප්‍රමාණ මත දිගටම පොලී සහ වෙනත් ගාස්තු අයකිරීමට බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

18.2 ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පත අවසන් කරනු ලැබූ අවස්ථාවක, ගෙවිය යුතු සියලු මුදල් ගෙවා අවසන් කර නිසි පරිදි සියලුම කාඩ්පත්වලින් අඩක් කපා ඒවා බැංකුව වෙත ආපසු භාරදෙනු ලබන තෙක් මේ නියම සහ කොන්දේසිවලට අනුකූලව සියලු ගාස්තු සහ වෙනත් ණය බැංකුවට ගෙවීම සඳහා එම ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා හෝ අතිරේක කාඩ්පත්හිමියන් (අදාළ වේ නම්) විසින් දිගටම එක්ව සහ වෙන් වෙන් වශයෙන් වගකීම දරනු ලැබිය යුතු ය.

18.3 බැංකුව විසින්, ඕනෑම විටකදී, පූර්ව දැනුම්දීමක් කරමින් හෝ නොකරමින් සහ හේතු දැක්වීමක් කරමින් හෝ නොකරමින් කාඩ්පත අවලංගු කිරීම හෝ කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් මේ ගිවිසුම අවසන් කරනු ලැබිය හැකි ය. එවැනි අවසන් කිරීමක් සිදුකරනු ලබන්නේ නම් මිස සහ එවැනි අවසන් කිරීමක් සිදුකරනු ලබන තෙක් බැංකුව විසින් කාඩ්පත්හිමියා හෝ කාඩ්පත්හිමියන් වෙත අලුත් කාඩ්පතක් (අලුත් කිරීමේ) ලබාදෙනු ලැබිය හැකි ය.

18.4 කාඩ්පත් ගිණුම අවසන් කරනු ලැබූ අවස්ථාවක වාර්ෂික ගාස්තුව හෝ ඉන් යම් කොටසක් ආපසු ලබාදීම සඳහා බැංකුව විසින් වගකීම දරනු නොලැබෙන්නේ ය.

18.5 බැංකුව විසින් කාඩ්පතක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, කාඩ්පත නිකුත් කිරීම සඳහා වූ සමපාර්ශ්විකයක් ලෙස බැංකුව විසින් යම් ඇපයක් දරනු ලබන්නේ නම්, කාඩ්පත මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලැබූ පසු බැංකුව විසින් එම ඇපය නිදහස් කරනු ලැබිය යුතු ය.

18.6 ඕනෑම පාර්ශ්වයක් විසින් මේ ගිවිසුම අවසන් කරනු ලැබූවද, එය නොතකා, කාඩ්පත භාවිත කිරීමෙන් ජනිත වන සියලු වැඩිදුර ගාස්තු ගෙවීම සඳහා කාඩ්පත්හිමියා විසින් දිගටම වගකීම දරනු ලැබිය යුතු ය.

## 19. වගකීම බැහැර කිරීම

19.1 පහත දැක්වෙන දේ මගින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ජනිත වන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාට කවර වූ හෝ ආකාරයකින් වගකීමට බැංකුව යටත් නොවන්නේ ය:-

19.1.1 බැංකුව හෝ වෙළෙන්දකු හෝ වෙනත් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් හෝ යම් ATM යන්ත්‍රයක් හෝ වෙනත් පාර්ශ්වයක් විසින් කාඩ්පත් ගනුදෙනුවකට අවසරදීම ප්‍රතික්ෂේප කිරීම හෝ ණය සීමාව දක්වා මුදල් අත්තිකාරම් ලබාදීම

නැතහොත් සැපයීම හෝ කිසිදු මුදල් අත්තිකාරමක් ලබාදීම නැතහොත් සැපයීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් කාඩ්පත්හිමියාට දැරීමට හෝ විඳීමට සිදු වූ කවර වූ හෝ පාඩුවක් හෝ අලාභයක්;

19.1.2 යම් වෙළෙන්දකු විසින් කාඩ්පත්හිමියාට සපයන ලද භාණ්ඩ හෝ සේවාවල ඇති යම් දෝෂයක් හෝ ඌනතාවක් හේතුවෙන් හෝ, අදාළ විටදී, වෙළෙන්දකු විසින් කාඩ්පත් ගනුදෙනුවක් උල්ලංඝනය කිරීම හෝ ඉටු නොකිරීම හේතුවෙන් කාඩ්පත පිළිගැනීම හෝ භාරගැනීම යම් ගෙවීම් සංවිධානයක සාමාජික ආයතනයක් හෝ යම් වෙළෙන්දකු විසින් ප්‍රතික්ෂේප කිරීම;

19.1.3 යම් ATM යන්ත්‍රයක්/ POS පර්යන්තයක් නිසි පරිදි ක්‍රියා නොකිරීම හෝ සන්නිවේදන පද්ධති බිඳවැටීම සහ/හෝ අකර්මන්‍යවීම;

19.1.4 එම ඉල්ලා සිටීම සහ ආපසු ලබාගැනීම බැංකුව හෝ වෙනත් යම් තැනැත්තකු හෝ ATM යන්ත්‍රයක්/ POS පර්යන්තයක් විසින් සිදු කරනු ලැබුවද සහ/හෝ ලබාගනු ලැබුවද, කාඩ්පතේ කැටයම් කර ඇති කාලය අවසන් වීමේ දිනයට පෙරාතුව කාඩ්පත ඉල්ලා සිටීමට සහ අපසු ලබා ගැනීමට බැංකුවට ඇති අයිතිවාසිකම  ක්‍රියාත්මක කිරීම;

19.1.5 18 වන වගන්තිය (අවසන් කිරීම) ප්‍රකාර යම් කාඩ්පතක් හෝ කාඩ්පත් ගිණුම අවසන් කිරීමට බැංකුවට ඇති අයිතිවාසිකම බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම;

19.1.6 කාඩ්පතේ අයිතිය නැවත ලබා ගැනීමට, කාඩ්පත ආපසු භාරදීම සඳහා වන යම් ඉල්ලීමකට හෝ කාඩ්පත පිළිගැනීම හෝ භාරගැනීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කිරීමට අදාළව

හෝ ඒ සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාගේ ණය තත්ත්වයට සහ කීර්තිනාමයට සිදුවන යම් හානියක්;

19.1.7 21 වන වගන්තිය (බැංකුවේ පොත්, වාර්තා සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු) ප්‍රකාර බැංකුව විසින් හෙළිදරව් කරන ලද විස්තරවල ඇති යම් වැරදි ප්‍රකාශයක්, වැරදි කරුණු සැපයීමක් දෝෂයක් හෝ නොකර හැරීමක්;

19.1.8 කාඩ්පත්හිමියා සහ යම් වෙළෙන්දකු හෝ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු අතර වන යම් ආරාවුලක්. එම ආරාවුල හෝ ප්‍රතියාචනය හෝ කාඩ්පත්හිමියාට එම වෙළෙන්දා හෝ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ තැනැත්තා සම්බන්ධයෙන් තිබිය හැකි හිලව් කිරීමේ අයිතිවාසිකමක් මගින් බැංකුව විෂයයෙහි කාඩ්පත්හිමියා සතු වගකීමට කිසිදු ආකාරයකින් බලපෑමක් නොවිය යුතු ය.

19.1.9 දේව ක්‍රියා, කලකෝලාහල, ජන කැළඹුම්, කැරලි, යුද්ධ, වසංගත හේතුවෙන් හෝ ස්වකීය පාලනයෙන් තොර වෙනත් යම් හේතූන් මත හෝ යම් වැඩවර්ජන හෝ සේවකයන් ආයතනයෙන් පිටමංලෑම් හේතුවෙන් ස්වකීය ව්‍යාපාර කටයුතු ඇනහිටීම මගින් ඇතිවන ප්‍රතිවිපාක.

## 20. ආයතනික කාඩ්පත්වල වගකීම

එකී සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය මණ්ඩලය, විධායක නිලධරයන්, අධ්‍යක්ෂවරුන් හෝ එකී සංස්ථාපිත මණ්ඩලය විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට අදාළව සුදුසුකම්ලත් සංස්ථාපිත මණ්ඩල වෙත නිකුත් කරන ලද සියලු ආයතනික කාඩ්පත් එම සංස්ථාපිත මණ්ඩලයේද, එමෙන්ම, කාඩ්පත්හිමියාගේ ද එක්ව සහ වෙන් වෙන් වශයෙන් වූ වගකීම යටතේ ක්‍රියාත්මක විය යුතු ය.

## 21. බැංකුවේ පොත්, වාර්තා සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු

21.1 බැංකුවේ පොත්, වාර්තා සහ ගිණුම් කාඩ්පත්හිමියා විෂයයෙහි තීරණාත්මක සහ බන්ධනීය විය යුතු ය. යම් නඩු කටයුත්තකදී හෝ වෙනත් දෙයකදී, බැංකුව විසින් නිකුත් කරන ලද යම් සහතිකයක්, මුද්‍රිත පිටපතක් හෝ ගිණුම් ප්‍රකාශයක් එහි නිරවද්‍යතාව සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාට විරුද්ධව ඇති අවසානාත්මක සහ තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

21.2 බැංකුව විසින් ලබාගන්නා හෝ බැංකුව වෙත ලැබෙන දුරකතන ඇමතුම් ගනුදෙනුකරුගේ සහ බැංකුවේ යහපත ආරක්ෂා කිරීම සඳහා වාර්තාගත කරනු ලැබිය හැකි බවට කාඩ්පත්හිමියා විසින් එකඟවනු සහ පිළිගනු ලැබේ.

21.3 බැංකුව විසින් ස්වකීය දත්ත, තොරතුරු සහ වාර්තා ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් හෝ සූක්ෂ්ම පටල හෝ වෙනත් ක්‍රමවේදවලින් (සැකසුම් මධ්‍යස්ථානවල සහ දත්ත ගබඩාවලද ඇතුළුව) පවත්වාගෙනයාම, සැකසීම සහ ගබඩා කිරීම සිදුකරනු ලැබිය හැකි බවට කාඩ්පත්හිමියා විසින් මෙයින් පිළිගනු සහ එකඟවනු ලබන අතර, බැංකුව විසින් ස්වකීය ලිපිගොනු, පොත්, වාර්තා හෝ ගිණුම්වල උද්ධෘතයක් ලෙස දක්වනු ලැබිය හැකි පණිවුඩ, කේබල් ෆැක්ස් පණිවුඩ, සූක්ෂම පටල, හඩපටි, පරිගණක මුද්‍රිත පිටපත් සහ ඡායාරූප මගින් ඒවායේ අන්තර්ගතයේ සත්‍යතාව පිළිබඳ තීරණාත්මක සාක්ෂි සංස්ථාපනය වන බවටද කාඩ්පත්හිමියා විසින් වැඩිදුරටත් එකඟවනු ලැබේ.

21.4 බැංකුව විසින් තුන්වන පාර්ශ්වීය කොන්ත්‍රාත්කරුවන්ගේ සේවා භාවිතා කරනු ලැබිය හැකි බවට ද එම තුන්වන පාර්ශ්වීය කොන්ත්‍රාත්කරුවන්ට කාඩ්පත්හිමියා සහ කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් වන තොරතුරු ද ඇතුළුව බැංකුවේ පොත්වලට සහ වාර්තාවලට ප්‍රවේශ විය හැකි බවටද කාඩ්පත්හිමියා විසින් පිළිගනු සහ එකඟවනු ලැබේ.

21.5 බැංකුව විසින් කාඩ්පත්හිමියා සහ බැංකුව අතර ඇති සම්බන්ධතාව පිළිබඳ විස්තර (ඉතිරි ශේෂ, ගිණුමේ ඉතිහාසය සහ කාඩ්පත්හිමියා සම්බන්ධයෙන්

වන තොරතුරු ද ඇතුළුව) බැංකුවේ වෙනත් යම් ශාඛාවකට හෝ කාර්යාලයකට; බැංකුවේ යම් අනුබද්ධිතයකුට හෝ බැංකුවේ යම් සාමාජිකයකුට; අධිකරණ නියෝගයකට අනුකූලව කටයුතු කිරීම පිණිස ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් නියාමන අධිකාරියකට; බැංකුවේ යම් විභව පැවරුම්ලාභියකුට; යම් ඇපකරුවකුට, තුන්වන පාර්ශ්වයකට හෝ ඇප ලබාදෙන්නෙකුට; යොමුකිරීමක් කිරීම සඳහා තුන්වන පාර්ශ්වයකින් ලැබුණු යම් ඉල්ලීමකට ප්‍රතිචාරයක් ලෙස එවැනි තුන්වන පාර්ශ්වයකට; සහ බැංකුවේ වෘත්තීය උපදේශකයන්ට, අනුයෝජිතයන්ට සහ ස්වාධීන කොන්ත්‍රාත්කරුවන්ට හෙළිදරව් කිරීමට සහ වාර්තා කිරීමට කාඩ්පත්හිමියා විසින් කැමැත්ත පළකරනු ලැබේ. ගනුදෙනුකරු විසින්, එවැනි යම් හෙළිදරව් කිරීමක හෝ වාර්තා කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් තමාට විඳීමට සිදුවූ හෝ විඳීමට සිදුවූයේ යයි කියනු ලබන යම් පාඩුවක්, අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුවට විරුද්ධව යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු අතර, ගනුදෙනුකරු විසින්, එවැනි හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමට තමාට ඇති අයිතිවාසිකම මෙයින් අත්හරිනු ලැබේ. කාඩ්පත්හිමියා හෝ කාඩ්පත්හිමියන් විසින් තවදුරටත් බැංකුවේ කාඩ්පතක් දරනු නොලබන විටදී එකී කැමැත්ත බලාත්මක විය යුතු ය.

21.6 කාඩ්පත් ඉල්ලුම්කරුගේ ණය තත්ත්වය පරීක්ෂා කිරීම සහ/හෝ බැංකුව විසින් සුදුසු යයි සලකනු ලබන ඕනෑම විටකදී කාඩ්පත්හිමියාට දැනුම් දීමක් කිරීමෙන් තොරව කාඩ්පත්හිමියාගේ ණය තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා බැංකුවට අයිතිවාසිකම තිබිය යුතු ය.

21.7 ගනුදෙනුකරු/ගනුදෙනුකරුවන් විසින් බැංකුව හෝ වෙනත් යම් කණ්ඩායම් සාමාජිකයකු සමඟ පවත්වාගෙන යන ව්‍යාපාරික ගිණුම හෝ ගනුදෙනුකරු/ගනුදෙනුකරුවන් සහ බැංකුව හෝ වෙනත් යම් කණ්ඩායම් සාමාජිකයකු අතර වන සම්බන්ධතාව පිළිබඳ තොරතුරු ද ඇතුළුව එහෙත් ඊට සීමා නොවී කාඩ්පත් ගිණුම් සම්බන්ධයෙන් වන යම් තොරතුරු යම් කාර්යයක් සඳහා පහත දැක්වෙන යම් තැනැත්තකුට හෝ ආයතනයකට

හෙළිදරව් කිරීම සඳහා බැංකුවට සහ හෝ එහි යම් නිලධරයන්ට/සේවා නියුක්තයන්ට අයිතිවාසිකම තිබිය යුතු ය:-

(i) බැංකුවේ යම් ශාඛාවක් හෝ වෙනත් යම් කණ්ඩායම් සාමාජිකයකු;

(ii) බැංකුව හෝ වෙනත් යම් කණ්ඩායම් සාමාජිකයකු විෂයයෙහි අධිකරණ බලය ඇති යම් නියාමන, අධීක්ෂණ හෝ රජයේ අධිකාරියක්;

(iii) නීතියක් මගින් හෝ අධිකරණ නියෝගයක් මඟින් එම හෙළිදරව් කිරීම කරන ලෙස නියම කර ඇති හෝ අවසර දී ඇති යම් තැනැත්තකු;

(iv) බැංකුව විෂයයෙහි රහස්‍යභාවය පිළිබඳ වගකීමට යටත් යම් තැනැත්තකු.

## 22. දුරකතන, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් නියෝග සඳහා බලය දීම සහ හානිපූරණය කිරීම

22.1 ඉහත දැක්වෙන කරුණුවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, වෙනත් කරුණු අතර, නියෝග ලබාදෙන හෝ ලබාදෙන්නේ යයි කියනු ලබන තැනැත්තාගේ අධිකාරි බලය හෝ අනන්‍යතාව සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු විමර්ශනයක් කිරීමෙන් තොරව සහ නියෝග ලැබුණු අවස්ථාවේදී පවත්නා අවස්ථානුගත කරුණු නොසලකා, කාඩ්පත්හිමියා හෝ කාඩ්පත්හිමියන් විසින් ඔහු/ඔවුන් වෙනුවෙන් කලින් කල දුරකතනයෙන්, ෆැක්ස් මගින් හෝ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් ලබාදෙන හෝ ලබාදෙන්නේ යයි කියනු ලබන යම් දැන්වීමක්, උපදෙසක්, ඉල්ලීමක් හෝ වෙනත් සන්නිවේදනයක් ("නියෝග") මත පදනම් හෝ ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා කාඩ්පත්හිමියා විසින් බැංකුවට බලය දෙනු ලැබේ. නියෝග ලැබුනු දිනය සහ වේලාව සහ නියෝග යැවූ දිනයන් සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක තීරණය බවට කාඩ්පත්හිමියා විසින් පිළිගනු ලැබිය යුතු ය.

22.2 එකී නියෝග සඳහා සම්පූර්ණ වශයෙන් බලය දී ඇති බවටද, කාඩ්පත්හිමියා එකී නියෝග මගින් බැඳී සිටින බවට ද සැලකීමට බැංකුව හිමිකම් ලැබිය යුතු අතර, එකී නියෝග මුදල් ගෙවීම සඳහා හෝ අන්‍යාකාරයකින් යම් ගිණුමක් හර කිරීමට හෝ යම් ගිණුමකට බැර කිරීමට වුවද නැතහොත් යම් මුදල් හෝ ලේඛන පැවරීම සම්බන්ධයෙන් වුවද නැතහොත් කාඩ්පත්හිමියා බැංකුව හෝ වෙනත් යම් තැනැත්තකු අතර වන යම් ගිවිසුමකින් හෝ වෙනත් වැඩපිළිවෙලකින් බැඳී සිටීමට යටත් කරවීමට අදහස් කරන ලද්දක් වුවද, නැතහොත්, ගනුදෙනුවේ හෝ වැඩපිළිවෙලේ ස්වභාවය හෝ අදාළ මුදල කුමක් වුවද සහ එකී නියෝගවල පදවල යම් වරදක්, බහුරූත්බවක්, වැරදි වැටහීමක් හෝ අපැහැදිලිභාවයක් තිබුණද, එය නොතකා, කාඩ්පත්හිමියා වෙනත් කවර වූ හෝ වර්ගයක ගනුදෙනුවකින් හෝ වැඩපිළිවෙලකින් බැඳී සිටීමට යටත් කරවීමට වුවද, බැංකුව විසින් උචිත යයි සලකනු ලැබිය හැකි පරිදි එකී නියෝග සම්බන්ධයෙන් හෝ එකී නියෝග මත පදනම්වී යම් පියවර ගැනීමටද බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

22.3 බැංකුව විසින් මේ බලය දීමේ සහ හානිපූරණය කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රතිෂ්ඨාවක් ලෙස මේ නියෝග හෝ මේ නියෝග උල්ලංඝනය කිරීමක් හෝ මේ ගිවිසුමේ දක්වා ඇති බැංකුවේ අයිතිවාසිකම් බලාත්මක කිරීමක් මගින් හෝ ඊට අදාළව කවර වූ හෝ ආකාරයකින් ජනිත වූ සහ කවර වූ හෝ ස්වභාවයකින් වූ, බැංකුවට දැරීමට සිදුවූ හෝ විඳීමට සිදුවූ සියලු පාඩු, හිමිකම්පෑම්, නඩු, නඩුකටයුතු, ඉල්ලීම්, අලාභ, පිරිවැය, වගකීම් සහ නඩු ගාස්තු හෝ අන්‍යාකාරයකින් වන වියදම් සඳහා බැංකුව හානිපූරණය කිරීමට ද බැංකුව හානිපූරණය කර තැබීමටද කාඩ්පත්හිමියා විසින් මෙයින් අනහෝසිකර ලෙස ප්‍රතිඥා දෙනු ලැබේ.

22.4 කාඩ්පත්හිමියාගෙන් මේ ගිවිසුම අවසන් කිරීමේ දැන්වීම ලැබීමෙන් පසු ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා සාධාරණ කාලයක් ලැබී ඇත්නම් මිස සහ ලැබෙන තෙක් මේ බලයදීම සහ හානිපූරණය කිරීමේ නියමයන් සම්පූර්ණ වශයෙන් බලාත්මක වන්නේ ය ක්‍රියාත්මක වන්නේ ය. එසේ වුවද, එකී ගිවිසුම අවසන් කිරීම මගින්, එකී දැන්වීම ලැබීමට පෙරාතුව මේ බලයදීම සහ හානිපූරණය කිරීමේ නියමයන්ට අනුකූලව කරන ලද යම් ක්‍රියාවක්

සම්බන්ධයෙන් මේ බලයදීම සහ හානිපූරණය කිරීම යටතේ වන යම් වගකීමකින් කාඩ්පත්හිමියා නිදහස් කරනු නොලැබේ.

22.5 ඉහත කී පරිදි දුරකතනයෙන්, ෆැක්ස් මගින් හෝ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යම් නියෝගයක් ලබාදීම බැංකුව වෙත යම් නියෝගයක් ලබාදීම සඳහා වූ ආරක්ෂිත ක්‍රමයක් නොවන බවට ද ඒ සම්බන්ධයෙන් වන අවදානම් පිළිබඳ තමා දැනුවත් බවටද කාඩ්පත්හිමියා විසින් පිළිගනු සහ එකඟවනු ලබන අතර, කාඩ්පත්හිමියාගේ පහසුව සඳහා මේ ගිවිසුමෙන් සලස්වා ඇති වැඩපිළිවෙලවල් හුදෙක්ම කාඩ්පත්හිමියාගේ වගකීම යටතේම පමණක් වන බවද කාඩ්පත්හිමියා විසින් තහවුරු කරනු ලැබේ.

## 23. හිලව් කිරීමේ අයිතිවාසිකම සහ ඇප ලෙස තබා ඇති මුදල්

23.1 යම් සාමාන්‍ය හිලව් කිරීමේ අයිතිවාසිකමකට හෝ නීතියෙන් හෝ වෙනත් යම් ගිවිසුමක් යටතේ පිරිනමන ලද වෙනත් අයිතිවාසිකම්වලට අමතරව, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි, ඕනෑම විටකදී, දැන්වීමක් කිරීමෙන් තොරව, කාඩ්පත්හිමියාගේ නමට බැංකුවේ ඇති කවර වූ හෝ ස්වභාවයකින් වු සහ කවර වූ හෝ ස්ථානයක පිහිටි සහ ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ වෙනත් යම් ව්‍යවහාර මුදල් වර්ගයකින් වූ යම් ගිණුමක් හෝ ගිණුම් සියල්ල හෝ ඉන් කිසිවක් එකතු කිරීම හෝ ඒකාබද්ධ කිරීම හෝ එකී ගිණුමේ හෝ ගිණුම්වල බැරට ඇති යම් මුදලක් කාඩ්පත්හිමියාගේ නමට බැංකුවේ ඇති කවර වූ හෝ ස්වභාවයකින් වූ හෝ කවර වූ හෝ ස්ථානයක පිහිටි සහ ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ වෙනත් යම් ව්‍යවහාර මුදල් වර්ගයකින් වූ යම් ගිණුමක් හෝ ගිණුම් යටතේ බැංකුවට අයවිය යුතු සියලු මුදල් පියවීම සඳහා හෝ ඒ වෙනුවෙන් හිලව් කිරීම හෝ මාරුකිරීම කරනු ලැබිය හැකි බවටද, එකී ගිණුමේ හෝ ගිණුම්වල ශේෂයන් කුමක් වුවද බැංකුව විසින් ඉහතකී දෑ සිදුකළ හැකි බවටද කාඩ්පත්හිමියා විසින් එකඟවනු ලැබේ. කාඩ්පත්හිමියා විසින්, එවැනි යම් එකතු කිරීමක්, ඒකාබද්ධ කිරීමක්, හිලව් කිරීමක් හෝ මාරු කිරීමක් ස්වකීය පරම අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන බැංකුවේ පවත්නා විනිමය අනුපාතිකයට අනුව අවශ්‍ය පරිවර්තනය සිදුකිරීම මගින් හිලව් කිරීමට බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

23.2 රිට් ආඥාවක් හෝ සිතාසි නිකුත් කරනු ලැබූ විට කාඩ්පත්හිමියාද ඇතුළු යම් පාර්ශ්වකරුවකුගේ වගකීම නොවෙනස්ව තබාගැනීමට හෝ කාඩ්පත්හිමියාගේ බංකොළොත්භාවය හෝ බුන්වත්භාවය ඔප්පු කිරීමට බැංකුවට හැකි කරවීමේ කාර්යය සඳහා හෝ බැංකුව විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් හේතුවක් මත, බැංකුව විසින්, ඕනෑම අවස්ථාවකදී, මේ ගිවිසුම යටතේ හෝ වෙනත් යම් ඇපයක් හෝ ඇපකරයක් යටතේ ලැබුණු, අයකරගත් හෝ උපලබ්ධි වූ යම් මුදලක්, එම මුදල හෝ ඉන් යම් කොටසක් බැංකුවට ලැබිය යුතු හෝ අයවිය යුතු මුදල් පියවීම සඳහා හෝ ඒ වෙනුවෙන් යෙදවීම සඳහා බැංකුව විසින් කිසිදු අතරමැදි වගකීමක් දැරීමෙන් තොරව, බැංකුව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි සහ බැංකුව විසින් විචක්ෂණශීලී යයි සලකනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කාඩ්පත්හිමියාගේ බැරට තැන්පත් කිරීම සහ තැබීම කරනු ලැබිය හැකි ය.

23.3 බැංකුව විසින්, ක්‍රෙඩිට් කාඩ්පතක් ලබාදෙන විට, ඇපයක් වශයෙන් තැන්පතු ගිණුමක මුදල් තැන්පත් කරන ලෙස කාඩ්පත්හිමියාට නියම කරනු ලැබිය හැකි ය. කාඩ්පතේ හිඟ මුදල මෙම ඇපවලට හිලව් කිරීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ.කාඩ්පත්හිමියා විසින් යම් අවස්ථාවකදී මෙම මුදල් වෙත ප්‍රවේශවීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඔහු විසින්, බැංකුව වෙත ඒ පිළිබඳ පූර්ව දැනුම්දීමක් කරනු ලැබිය යුතු අතර, බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, කාඩ්පතේ මුලු හිඟ මුදල එම ඇපයෙන් අයකර ගැනීමෙන් පසු, ඇපයක් ලෙස තබා ඇති එම මුදල නිදහස් කරනු ලැබිය යුතු ය.

## 24. නෛතික පියවර

යම් හේතුවක් මත කාඩ්පත්හිමියා විසින් මේ ගිවිසුමේ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, බැංකුව විසින්, මේ කාඩ්පත්හිමියා සම්බන්ධයෙන් වන ගිවිසුම අවසන් කර, ඒ යටතේ වන සියලු හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කරනු ලැබිය හැකි ය. නඩු ගාස්තුද ඇතුළුව බැංකුව විසින් දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වියදම් සම්පූර්ණ වශයෙන් හානිපූරණය කිරීමේ වගකීම කාඩ්පත්හිමියා විසින් දරනු ලැබිය යුතු ය.

## 25. දැන්වීම්

25.1 කාඩ්පත්හිමියා විසින්, අනිවාර්යයෙන්ම, නමේ, රැකියාවේ හෝ ව්‍යාපාරයේ හෝ ලිපිනයේ (කාර්යාලයේ සහ/හෝ නිවසේ) සහ අදාළ දුරකතන අංකවල සිදුවන යම් වෙනසක් නොපමාව බැංකුව වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබිය යුතු ය.

25.2 සියලුම කාඩ්පත්, PIN අංක, ගිණුම් අංක, නියෝග හෝ මේ නියම සහ කොන්දේසි යටතේ වන වෙනත් යම් සන්නිවේදනයක් පෞද්ගලිකවම භාරදීම හෝ කාඩ්පත්හිමියා අවසන් වරට සිටි බවට සැලකෙන බිල්පත් යැවීමේ හෝ වෙනත් යම් ලිපිනයකට කුරියර් මාර්ගයෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් යැවීම කරනු ලැබිය හැකි අතර, අතින් භාරදෙනු ලැබුවේ නම්, භාරදුන් දිනයේදී ද, කුරියර් මාර්ගයෙන් හෝ තැපැල් මගින් යවනු ලැබුවේ නම්, එසේ යැවීමෙන් වැඩකරන දින තුනකට (3) පසු වන දිනයේදී ද එම සන්නිවේදනය කාඩ්පත්හිමියා වෙත භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

25.3 මේ නියම සහ කොන්දේසි යටතේ ප්‍රාථමික කාඩ්පත්හිමියා වෙත යවනු ලැබූ සියලු සන්නිවේදන, ප්‍රාථමික කාඩ්පත්හිමියා සහ අතිරේක කාඩ්පත්හිමියා යන දෙපාර්ශවය වෙතම යවනු ලැබූ සන්නිවේදනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

25.4 බැංකුවේ හෝ එහි නිෂ්පාදන සහ සේවා පිළිබඳ සියලු අලෙවිකරණ තොරතුරු විද්‍යුත් තැපැල්, එස්.එම්.එස්, ෆැක්ස්, දුරකතන ආදිය මාර්ගයෙන් ලබාගැනීමට කාඩ්පත්හිමියා විසින් බැංකුවට බලය දෙනු ලැබේ.

## 26. සාමාන්‍ය කරුණු

26.1 කාඩ්පත්හිමියාගේ නියෝග අනුව සද්භාවයෙන් ක්‍රියාකිරීම සඳහා බැංකුව විසින් වගකීම දරනු නොලැබිය යුතු ය.

26.2 ස්වකීය අභිමතය පරිදි එවැනි යම් නියෝගයක් වාර්තාගත කිරීමටද, එම වාර්තා යම් අධිකරණයකදී හෝ නඩු කටයුත්තකදී සාක්ෂි වශයෙන් භාවිත කිරීමටද කාඩ්පත්හිමියා විසින් බැංකුවට බලය දෙනු ලැබේ.

26.3 මේ ගිවිසුම යටතේ කාඩ්පත්හිමියාගෙන් බැංකුවට අයවිය යුතු සියලු මුදල් එකතු කරගැනීම සඳහා අනුයෝජිතයකු පත්කිරීම සඳහා බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

26.4 ඕනෑම විටකදී, කාඩ්පත්හිමියාට දැනුම්දීමක් කරමින් හෝ නොකරමින්, කාඩ්පත්හිමියාගේ කැමැත්තෙන් තොරව ස්වකීය අයිතිවාසිකම් හෝ බැඳියාවන් සියල්ල හෝ ඉන් කොටසක් පැවරීම සඳහා බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

26.5 කලින් කල බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි පරිදි යම් වැඩිදුරටත් වු ලේඛනයකට හෝ ලේඛනවලට අත්සන් කිරීමට කාඩ්පත්හිමියා විසින් ප්‍රතිඥාදෙනු ලැබේ.

26.6 මෙහි සඳහන් අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සමුච්චිත වන අතර, නීතියෙන් විධිවිධාන සලස්වා ඇති යම් අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්ම ඉන් බැහැර කර නොමැත.

26.7 බැංකුව විසින් එකී අත්හැරීම ලිඛිතව නිවේදනය කරනු ලබන්නේ නම්, බැංකුව විසින්, ඕනෑම අවස්ථාවකදී, මේ නියම සහ කොන්දේසි කිසිවක් හෝ කාඩ්පත්හිමියා විසින් සිදුකරන ලද යම් පැහැර හැරීමක් හෝ උල්ලංඝනය කිරීමක් කොන්දේසිවිරහිතව හෝ අන්‍යාකාරයකින් අත්හරිනු ලැබිය හැකි අතර,ඉහතකී පරිදි හැර මේ නියම සහ කොන්දේසි කිසිවක් පැහැර හැරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් සිදුකරන ලද කිසිදු තත්වාරෝපණය කිරීමක් හෝ සමාවදීමක් හෝ නොසලකාහැරීමක් හෝ සහනශීලතාවක් බැංකුවේ අයිතිවාසිකම් සහ බලතල අත්හැරීමක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය. තවද, බැංකුව වෙත ලිඛිතව ප්‍රකාශ කර ඇත්නම් මිස, බැංකුව විසින් කරන ලද හෝ නොකරන ලද යම් දෙයකින් කිසිදු අත්හැරීමක් පිළිබඳ ගම්‍ය වනු හෝ හැඟවෙනු නොලැබිය යුතු ය. යම්

අත්හැරීමක් එම අත්හැරීම අදාළවන කරණ අත්හැරීමක් ලෙස පමණක් ක්‍රියාත්මක විය යුතු අතර, එය වෙනත් නියම සහ කොන්දේසි කිසිවක් අත්හැරීමක් හෝ නිදහස් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.

26.8 අදාළ වෙළෙන්දන් විසින් ලබාදෙන විශේෂ වට්ටම්/දීමනා සම්බන්ධයෙන් බැංකුව විසින් වගකීම දරනු නොලැබිය යුතු අතර, බැංකුව විසින්, එම දීමනාවල දක්වා ඇති පරිදි ඊට අදාළ භාරදීම, තත්ත්වය, නිර්මාණය, පිරිවිතර හෝ වෙනත් කරුණු සම්බන්ධයෙන් යම් සහතිකයක් ලබාදීම හෝ යම් නියෝජනයක් කිරීම කරනු නොලැබිය යුතු ය.

26.9 බැංකුවේ ලිපි ආපසු නොලැබුනු සහ කාඩ්පත්හිමියා සම්බන්ධ කරගත නොහැකි අවස්ථාවක, ගිණුම් ප්‍රකාශ සහ/හෝ ලිපි ගනුදෙනු බැංකුවේ කාඩ්පත් ඉල්ලුම්පත්‍රයේ නම්කර ඇති වෙනත් ලිපිනයකට නැවත යොමුකිරීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ.

## 27. නියම වෙනස් කිරීම

27.1 බැංකුව විසින් කලින් කල මේ ගිවිසුමේ නියම සහ කොන්දේසි වෙනස් කරනු ලැබිය හැකි ය. ව්‍යවස්ථාවල නියමයන්ට සහ/ හෝ නියාමන නියමයන්ට යටත්ව බැංකුව විසින්, එවැනි යම් වෙනස් කිරීමක් පිළිබඳ නිවේදනය ලිඛිතව හෝ පළ කිරීමෙන් කාඩ්පත්හිමියා වෙත ලබාදෙනු ලැබිය යුතුය. එවැනි වෙනස් කිරීම් සියලුම නොගෙවූ මුදල් ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම්, පිරිවැය සහ කාඩ්පත් ගනුදෙනු සඳහා අදාළ විය යුතු ය.

27.2 එවැනි මේ ගිවිසුමේ නියම සහ කොන්දේසි වෙනස් කිරීමක් බලාත්මක වන දිනෙන් පසු කාඩ්පත පවත්වාගෙන යාම හෝ භාවිත කිරීම මගින් කාඩ්පත්හිමියා විසින් කිසිදු ව්‍යතිරේකයකින් තොරව එම වෙනස් කිරීම් පිළිගනු ලැබූ බව සංස්ථාපනය වන ලෙස සලකනු ලැබිය යුතු ය. කාඩ්පත්හිමියා විසින් යෝජිත වෙනස්කම් පිළිගනු නොලබන්නේ නම්, කාඩ්පත්හිමියා විසින්, එම වෙනස්කම් බලාත්මක වන දිනට පෙරාතුව ලිඛිත දැන්වීමක් කිරීමෙන් කාඩ්පත භාවිත කිරීම අවසන් කරනු ලැබිය යුතු අතර, එතැන් සිට, 18 වගන්තිය (අවසන් කිරීම) ක්‍රියාත්මක විය යුතු ය.

**28. ගිවිසුමේ බලපෑම්**

28.1 මේ ගිවිසුම අවසන් කරනු ලැබුවද, එය නොතකා, මෙහි අන්තර්ගත සියලු විධිවිධාන, සිදුකළ යම් කාඩ්පත් ගනුදෙනුවලට සහ කාඩ්පත්හිමියා සහ යම් අතිරේක කාඩ්පත්හිමියකු හෝ අතිරේක කාඩ්පත්හිමියන් විසින් දරන ලද බැරකම්වලට අදාළව කාඩ්පත්හිමියා සහ යම් අතිරේක කාඩ්පත්හිමියකු හෝ අතිරේක කාඩ්පත්හිමියන් විෂයයෙහි දිගටම පූර්ණ වශයෙන් බලාත්මක විය යුතුය සහ ක්‍රියාත්මක විය යුතු ය.

28.2 මේ එක් එක් නියම සහ කොන්දේසි එකිනෙකෙන් වෙන්කරනු ලැබිය හැකි අතර, එකිනෙකට වෙනස් ද වන්නේ ය. යම් අවස්ථාවකදී එකී නියම සහ කොන්දේසි එකක් හෝ වැඩි සංඛ්‍යාවක් අවලංගු, නීතිවිරෝධී හෝ බලාත්මක කළ නොහැකි වන හෝ වූ අවස්ථාවක, එමගින් අනෙකුත් විධිවිධානවල වලංගුභාවයට, නීත්‍යානුකූලභාවයට හෝ බලාත්මක කළ හැකි බවට කිසිදු ආකාරයකින් බලපෑමක් හෝ හානියක් නොවිය යුතු ය.

**29. කාඩ්පත්හිමියා විදේශගත වීම**

29.1 විදේශ රටකට සංක්‍රමණය වන සහ/හෝ ස්ථිර රැකියාවක් සඳහා විදේශගතවන හෝ ඒ අවස්ථාවේදී බලපවත්නා විදේශ විනිමය නියෝගවල අර්ථනිරූපණ ප්‍රකාර "අනේවාසිකයකු" ලෙස සලකනු ලබන කාඩ්පත්හිමියකු විසින්, තමා විදේශගතවීමට දින තිහකට (30) පෙරාතුව ඒ පිළිබඳ බැංකුව වෙත ලිඛිතව දැනුම් දී බිල්පත් යවා ඇති සහ බිල්පත් යවා නොමැති සියලු ගාස්තු ගෙවා අවසන් කරනු ලැබිය යුතු අතර, එමෙන්ම, කාඩ්පත සහ යම් අතිරේක කාඩ්පත් කිසිවක් වේ නම්, එම අතිරේක කාඩ්පත් බැංකුව වෙත ආපසු බාරදෙනු ලැබිය යුතු ය. එවිට, කාඩ්පත සහ අතිරේක කාඩ්පත් අවසන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් 18 වන වගන්තිය (අවසන් කිරීම) අදාළ විය යුතු ය.

29.2 එම කාඩ්පත මගින් ලබාගත් විදේශ විනිමය NRFC, RFC, RNNFC ගිණුමක හෝ අක්වෙරළ ගිණුමක බැරට ඇති මුදල්වලින් පියවීම සඳහා එම කාඩ්පත නිකුත් කර ඇත්නම් මිස, කාඩ්පත්හිමියා විසින් සංක්‍රමණය වීම සඳහා හෝ

රැකියාවක් සඳහා හෝ ස්ථිර පදිංචිය සඳහා විදේශගතවන අවස්ථාවක, ඔහු විසින්, තමා වෙත නිකුත් කර ඇති කාඩ්පත බැංකුව වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

## 30. විදේශීය ජාතිකයන් සඳහා නිකුත් කරනු ලබන කාඩ්පත්

30.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද තත්කාලයේ බලපවත්නා නියෝගවලට යටත්ව විදේශීය ජාතිකයකු වෙත කාඩ්පතක් නිකුත් කරනු ලැබිය හැකි ය.

තමා ශ්‍රී ලංකාවෙන් විදේශ රටකට සංක්‍රමණය වන්නේ නම්, ඊට එක් මසකට පෙරාතුව සහ/හෝ තම නේවාසික වීසා බලපත්‍රයේ කාලය අවසන්වීමට එක් මසකට පෙරාතුව, කාඩ්පත්හිමියා විසින්, ඒ පිළිබඳ බැංකුව වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබිය යුතු ය. එසේම, ඉහතකී යම් සිද්ධියක් සිදුවීමට පෙරාතුව, ඔහු විසින්, බිල්පත් යවා ඇති සහ බිල්පත් යවා නොමැති සියලු ගාස්තු ගෙවා අවසන් කර තම කාඩ්පත හෝ කාඩ්පත් බැංකුව වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

## 31. පාලනය වන නීතිය

31.1 මේ නියම සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිවලින් පාලනය වන අතර, ඒ අනුව තේරුම්ගත යුතු ය. කාඩ්පත්හිමියා විසින් ශ්‍රී ලංකාවේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලයට මෙයින් අනතෝසිකර ලෙස යටත් වනු ලැබේ. එසේ වුවද, එකී යටත්වීම මගින් වෙනත් යම් අධිකරණ බලප්‍රදේශයකදී කාඩ්පත්හිමියාට විරුද්ධව නඩු පැවරීම සඳහා බැංකුව සතු අයිතිවාසිකමට අගතියක් නොවිය යුතු ය.

31.2 නීතිය, රජයේ නියෝග හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් මගින් යම් සංශෝධන අවශ්‍ය කරනු ලබන අවස්ථාවක මේ නියම සහ කොන්දේසි එසේ ස්වයංක්‍රීයවම සංශෝධනය වනු ලැබේ. කාඩ්පත් ගිණුම නීත්‍යානුකූල සහ වලංගු කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය හැකි ය. කාඩ්පත්හිමියා විසින් කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම

වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක හෝ කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කිරීමට තුන්වන පාර්ශ්වයකට අවසර දෙනු ලබන අවස්ථාවක, කාඩ්පත්හිමියා විසින් එම භාවිතය සම්බන්ධයෙන් වගකීම දරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම භාවිතය හේතුවෙන් එම පාර්ශ්වකරුවන් සියලුදෙනාටම හෝ ඉන් යම් පාර්ශ්වකරුවකුට ගෙවීමට සිදුවූ සියලු මුදල් සහ/හෝ වියදම් බැංකුවට හෝ අදාළ ගෙවීම් කාඩ්පත් සංවිධානයට ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවකදී වහාම එම ගෙවීම් අත්හිටුවා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඒ පිළිබඳව දැනුම්දීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ.

31.3 කාඩ්පත මගින් විදේශ විනිමය ගනුදෙනු සිදුකරනු ලබන බවට සැක කිරීමට බැංකුවට සාධාරණ හේතු ඇති අවස්ථාවක කාඩ්පත තුළ ඇති විදේශ විනිමය වහාම අත්හිටුවා ඒ පිළිබඳ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම්දීමේ අයිතිවාසිකම බැංකුව සතු වේ. කාඩ්පත්හිමියකු විසින් කාඩ්පතක් මගින් සිදුකරන ලද විදේශ විනිමය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම ද බැංකුව සතු වේ.

31.4 2021 අංක 03 දරන විදේශ විනිමය විධානය මගින් නියම කර ඇති පරිදි, කාඩ්පත්හිමියා විසින්, ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

31.5 එකී ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී, කාඩ්පත්හිමියා විසින්, කලින් කල සංශෝධිත 2021 අංක 03 දරන විධානයේ දක්වා ඇති නියම සහ කොන්දේසි තමා විසින් කියවා තේරුම්ගෙන ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය.

31.6 2017 අංක 12 දරන විදේශ විනිමය පනත (වි.වි.ප) යටතේ නිකුත් කරන ලද 2023 අංක 03 දරන විධානය මේ ගිවිසුමට අමුණා ඇති අතර එය මේ නියම සහ කොන්දේසිවල ප්‍රධාන කොටසක් වේ. තවද,කාඩ්පත මගින්

විදේශ විනිමය ගනුදෙනු සිදුකිරීමේදී එම විධානය කියවා තේරුම්ගෙන අදාළ කරගනු ලැබිය යුතු ය.

**ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත් (EFTC) සම්බන්ධයෙන් බලයලත් වෙළෙන්දන් වෙත නිකුත් කරනු ලබන විධාන**

1. 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (වි.වි.ප) 5 වන, 6 වන සහ 7 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත දැක්වෙන කරුණුවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට විදේශ විනිමය මගින් ගෙවීම් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වෙත EFTC කාඩ්පත් නිකුත් කිරීමට බලයලත් වෙළෙන්දන්ට (AD) අවසර ඇත්තේ ය.

2. බලයලත් වෙළෙන්දන් විසින්, (මෙහි මින්මතු "කාඩ්පත්හිමියන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වෙත නිකුත් කරනු ලබන EFTC කාඩ්පත් මේ විධානවල 10.1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා ගෙවීම් සිදුකිරීම සඳහා හැර පෞද්ගලික ස්වභාවයේ ජංගම ගනුදෙනු සඳහා පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට ගෙවීම් සිදුකිරීම සඳහා භාවිත කරනු ලැබිය හැකි බවට වගබලා ගනු ලැබිය යුතු ය.

3. ඊට අමතරව, එකී කාඩ්පත්හිමියන්ගේ අදාළ ගිණුම්වල ඇති මුදල්වලට අදාළව පහත දැක්වෙන තැනැත්තන් වෙත ඩෙබිට් කාඩ්පත් නිකුත් කිරීමටද බලයලත් වෙළෙන්දන්ට අවසර ඇත්තේ ය:-

   (අ) ව්‍යාපාර කටයුතු, අධ්‍යාපන කටයුතු හෝ වෛද්‍ය කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු;

   (ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (BFCA) දරන්නකු;

(ඇ) පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (PFCA) දරන්නකු;

(ඈ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (DFCA) හෝ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමක් (DRA) දරන්නකු;

(ඉ) ආමුඛ ආයෝජන ගිණුමක් (IIA) දරන්නකු;

(ඊ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් (CTRA) දරන්නකු;

(උ) විගාමිකයකුගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් (ERIA) දරන්නකු;

(ඌ) අනේවාසික රුපියල් ගිණුමක් (NRRA) දරන්නකු;

(එ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුමක් (RGRCA) දරන්නකු;

(ඒ) ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ රුපියල් ගිණුමක් (SFNRA) දරන්නකු.

4. බලයලත් වෙළෙන්දන් විසින්, ණය අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමෙන් පසු පහත දැක්වෙන තැනැත්තන් වෙත ක්‍රෙඩිට් කාඩ්පත් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර සහ/හෝ රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පත් දරන විදේශීය පුරවැසියන්ට.

(ආ) එම ක්‍රෙඩිට් කාඩ්පත්වලින් දරනු ලැබ ඇති වියදම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ERIA ගිණුම් ඇත්නම් එම ගිණුම්වල ඇති විදේශ රටවලින් ලැබෙන ආමුඛ ප්‍රේෂණ මුදල්

මගින් පියවා ගනු ලැබිය යුතු අවස්ථාවක සමපාර්ශ්විකය/ඇපය ලෙස තබා ඇති එම තැනැත්තන්ගේ ශ්‍රී ලංකාවේ තිබෙන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති මුදල්වලින් 90%ක සීමාවක් දක්වා පමණක්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට;

(ඇ) එම ක්‍රෙඩිට් කාඩ්පත්වලින් දරනු ලැබ ඇති වියදම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ERIA ගිණුම් ඇත්නම් එම ගිණුම්වල ඇති විදේශ රටවලින් ලැබෙන ආමුඛ ප්‍රේෂණ මුදල් මගින් හෝ කාඩ්පත්හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයුම් මගින් පියවාගැනීමට යටත්ව, ශ්‍රී ලංකාවේ නේවාසියකුව සිටිමින් ශ්‍රී ලංකාවේ සහ වෙනත් යම් රටක ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයන්.

(5) බලයලත් වෙළෙන්දන් විසින්, මේ විධානවල 3 වන සහ 4 වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කාඩ්පත්හිමියන් වෙත නිකුත් කරනු ලබන EFTC කාඩ්පත් පහත දැක්වෙන කරුණුවලට යටත්ව භාවිත කරනු ලබන බවට වගබලාගනු ලැබිය යුතු ය:-

(අ) ශ්‍රී ලංකාව තුළ සිදුකරන ආයෝජන සඳහා ගෙවීම් සිදුකිරීමට භාවිත කිරීම සඳහා හැර ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් යම් ගෙවීමක් සිදුකිරීම සඳහා අවසර ඇත.

(ආ) පහත දැක්වෙන තැනැත්තන්ට EFTC කාඩ්පතක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඕනෑම කාර්යයක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට යම් ගෙවීමක් සිදුකිරීම සඳහා සම්පූර්ණයෙන්ම අවසර ඇත:-

(i) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වන PFCA ගිණුමක් දරන්නකු.

(ii) DFCA ගිණුමක් දරන්නකු.

(iii) IIA ගිණුමක් දරන්නකු.

(iv) ERIA ගිණුමක් දරන්නකු.

(ඇ) පහත දැක්වෙන තැනැත්තන්ට EFTC කාඩ්පතක් තැන්පතුවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, (මේ විධානවල 10.1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා ගෙවීම් සිදුකිරීමට භාවිත කිරීම සඳහා හැර) පෞද්ගලික ස්වභාවයේ ජංගම ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට යම් ගෙවීමක් සිදුකිරීම සඳහා අවසර ඇත:-

(i) BFCA ගිණුමක් දරන්නකු.

(ii) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන PFCA ගිණුමක් දරන්නකු.

(iii) ව්‍යාපාරික කටයුතු, අධ්‍යාපනික කටයුතු හෝ වෛද්‍ය කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරට ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු.

(iv) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද/ සංස්ථාගත කරන ලද ව්‍යාපාර ආයතනයක් හෝ සමාගමක් වන NRRA ගිණුමක් දරන්නකු.

(v) DRA ගිණුමක් දරන්නකු.

(vi) RGRCA ගිණුමක් දරන්නකු.

(vii) SFNRA ගිණුමක් දරන්නකු.

(ඈ) පහත දැක්වෙන තැනැත්තන්ට EFTC කාඩ්පතක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, එම EFTC කාඩ්පත දරන්නාගේ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට යම් ගෙවීමක් සිදුකිරීම සඳහා අවසර ඇත:-

(i) BFCA ගිණුමක් දරන්නකු.

(ii) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන PFCA ගිණුමක් දරන්නකු.

6. බලයලත් වෙළෙන්දන් විසින්, පහත 10.1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා ගෙවීම් සිදුකිරීමට භාවිත කිරීම සඳහා හැර එම ව්‍යාපාර ආයතනයේ ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමයවලින් යම් ගෙවීමක් සිදුකිරීම සඳහා වන අනුමත අභ්‍යන්තර කාර්යපටිපාටියකට අනුව, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වන එම ව්‍යාපාර ආයතනවල නම්කළ සේවානියුක්තයන්ගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ නම්වලට, ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සමාගම්/ආයතන (එනම්,ව්‍යාපාර ආයතන) වෙත EFTC කාඩ්පත් නිකුත් කරනු ලැබිය හැකි ය.

7. බලයලත් වෙළෙන්දන් විසින්, BFCA ගිණුම්, BFCA ගිණුම්, DFCA ගිණුම්, DRA ගිණුම්, IIA ගිණුම් හෝ ERIA ගිණුම්වල ඇති මුදල් මගින් විදේශ විනිමයවලින් ගෙවීම් පියවීම සඳහා හෝ හිඟමුදල් ආමුඛ ප්‍රේෂණ මගින් ගෙවීමේ පදනමින් EFTC කාඩ්පතක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක හැර, කාඩ්පත්හිමියා විසින් විදේශ රටකට සංක්‍රමණය වන්නේ නම් හෝ ස්ථිර පදිංචිය හෝ රැකියාවක් සඳහා විදේශගත වන්නේ නම් ශ්‍රී ලංකාවේ සිටින එම කාඩ්පත්හිමියා වෙත නිකුත් කරන ලද කාඩ්පත, එය නිකුත් කරන ලද බැංකුවට භාරදෙනු ලැබිය යුතු බවට වන කොන්දේසියට යටත්ව ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වෙත EFTC කාඩ්පත් නිකුත් කරනු ලැබිය යුතු ය.

8. බලයලත් වෙළෙන්දන් විසින්, ඩෙබිට් කාඩ්පතක් භාවිත කරමින් විදේශ ව්‍යවහාර මුදල් ලබාගනු ලැබූ විට හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් මගින් මුදල් අත්තිකාරමක් ලබාගනු ලැබූ විට එම ව්‍යවහාර මුදල් මේ විධාන යටතේ

අවසරදී ඇති ගනුදෙනු සඳහා භාවිතකර ඇති බවට වූ සාක්ෂි ව්‍යවස්ථාපිත වාර්තා තබාගැනීමේ කාලසීමාව දක්වා තබාගන්නා ලෙස කාඩ්පත්හිමියන් දැනුවත් කරනු ලැබිය යුතු ය.

9. බලයලත් වෙළෙන්දන් විසින්, මේ විධානවල විෂය පථයෙන් පිටත වූ යම් කාර්යයක් සඳහා EFTC කාඩ්පතක් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකුට යම් ගෙවීමක් සිදුකිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබාගන්නා ලෙස කාඩ්පත්හිමියන්ට විධාන කරනු ලැබිය යුතු ය.

10. වෙනත් කොන්දේසි

10.1 බලයලත් වෙළෙන්දන් විසින්, කාඩ්පත්හිමියන් වෙත නිකුත් කරන ලද EFTC කාඩ්පත් පහත දැක්වෙන දේ සඳහා භාවිත නොකරන බවට වගබලාගනු ලැබිය යුතු ය:-

අ. විදේශ විනිමය ගනුදෙනු (Forex වෙළඳාම);

ආ. තථ්‍ය ව්‍යවහාර මුදල් ගනුදෙනුවලට අදාළ ගෙවීම්;

ඇ. ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරන ඔට්ටු ඇල්ලීම්, සූදු සහ සූදුක්‍රීඩා කටයුතුවලට අදාළ ගෙවීම්;

ඈ. 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සහ ඊට කරන ලද යම් සංශෝධන යටතේ නිකුත් කරන ලද නියෝග සහ මෙහෙයුම් උපදෙස්වලට යටත්ව වාණිජ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීමට අදාළ ගෙවීම්.

10.2 බලයලත් වෙළෙන්දන් විසින්, මේ විධානවල EFTC කාඩ්පත් සම්බන්ධයෙන් බලපවත්නා නියෝග කාඩ්පත්හිමියා කැමති භාෂාවකින් ලිඛිතව (ඉලෙක්ට්‍රොනිකව හෝ ලේඛන ස්වරූපයෙන්)

කාඩ්පත්හිමියා වෙත දැනුම් දී සහ සන්නිවේදනය කර EFT කාඩ්පත් නිකුත් කරන අවස්ථාවේදී I වන ඇමුණුම ප්‍රකාර එම කාඩ්පත්හිමියාගෙන් ප්‍රකාශයක් ලබාගනු ලැබිය යුතු ය.

10.3 කාඩ්පත්හිමියන් විසින් EFTC කාඩ්පත් භාවිත කරමින් මේ විධානවල නිශ්චිතව දක්වා ඇති අවසරලත් ගනුදෙනු පමණක් සිදුකරන බවට බලයලත් වෙළෙන්දන් විසින් වගබලාගනු ලැබිය යුතු ය.

10.4 යම් කාඩ්පත්හිමියකු විසින් මේ විධානවලින් අවසරදී නොමැති කාර්ය සඳහා විදේශ විනිමයවලින් ගෙවීම්/මුදල් ආපසු ලබාගැනීම් සිදුකරන බවට සැක කිරීම සඳහා සාධාරණ හේතු ඇති අවස්ථාවක, බලයලත් වෙළෙන්දන් විසින්, EFTC කාඩ්පත් මගින් විදේශ විනිමයවලින් සිදුකරන ලද ගෙවීම්/මුදල් ආපසු ලබාගැනීම් අත්හිටුවීම සඳහා නිසි උද්යෝගයකින් කටයුතු කර, වහාම ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම්දෙනු ලැබිය යුතු ය.

10.5 බලයලත් වෙළෙන්දන් විසින්, එක් එක් කාඩ්පත්හිමියාගේ විදේශ විනිමය සහ ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු වෙන වෙනම හඳුනාගනු ලැබිය යුතු ය.

10.6 ප්‍රාථමික කාඩ්පත්හිමියන් ද ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් වන අවස්ථාවක හැර, බලයලත් වෙළෙන්දන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට අතිරේක කාඩ්පත් ලෙස EFTC කාඩ්පත් නිකුත් කරනු නොලැබිය යුත ය. අතිරේක කාඩ්පත් නිකුත් කිරීම සහ භාවිත කිරීම මේ විධානවල දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්විය යුතු ය.

10.7 බලයලත් වෙළෙන්දන් විසින්, සෑම විටකදීම, රැකියාව සඳහා හෝ අධ්‍යාපනික කටයුතු සඳහා හෝ විදේශගතව ඇති කාඩ්පත්හිමියන්ගේ නේවාසික තත්ත්වයේ වෙනසක් සම්බන්ධයෙන් පරීක්ෂාකර මේ

විධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් උචිත පියවර ගනු ලැබිය යුතු ය.

10.8 ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ දැනටමත් නිකුත්කර ඇති EFTC කාඩ්පත් මේ විධානවල දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

11. මාසිකව වාර්තා කිරීම - බලයලත් වෙළෙන්දන් විසින්, විදේශ ව්‍යවහාර මුදල්වලින් මුදල් ආපසු ලබාගැනීම්ද ඇතුළුව, විදේශ විනිමයවලින් ගෙවීම් සිදුකර ඇති කාඩ්පත්හිමියන්ගේ කවර හෝ වටිනාකමකින් යුතු සියලු ගනුදෙනු පිළිබඳ විස්තර මාසිකව විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතිය - FOREX net මාර්ගයෙන් ඉලෙක්ට්‍රොනික වශයෙන් පමණක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

12. බලයලත් වෙළෙන්දන් විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂා කිරීම සඳහා, I වන ඇමුණුම සහ II වන ඇමුණුම ද ඇතුළුව EFTC කාඩ්පත් නිකුත් කිරීම සහ අලුත් කිරීම සම්බන්ධයෙන් වන යම් තොරතුරු හෝ ලේඛන වසර හයක කාලසීමාවක් හෝ ව්‍යවස්ථාපිත වාර්තා තබාගැනීමේ කාලසීමාව යන කාලසීමාවන්ගෙන් වැඩි කාලසීමාව දක්වා තබාගනු ලැබිය යුතු ය.

13. මේ විධානවල කාර්ය සඳහා:-

(i) "ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත (EFTC)" යන්නෙන්, භාවිත කරන්නාට ණය මගින්, හර කිරීම් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් වටිනාකම මාරුකිරීමට හැකි කරවන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, ඊට විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමේ කාර්යය සඳහා බලයලත් වෙළෙන්දන්ට ගනුදෙනු පිළිබඳ විස්තර හඳුනාගත හැකි වන ක්‍රෙඩිට්

කාඩ්පත්, ඩෙබිට් කාඩ්පත් සහ වටිනාකම ගබඩාකර ඇති කාඩ්පත් ද ඇතුළත් වේ;

(ii) ‘‘ඩෙබිට් කාඩ්පත’’ යන්නෙන්, කෙළින්ම කාඩ්පත්හිමියාගේ ගිණුමේ බැර ශේෂයෙන් හර කිරීම මගින් මුදල් ආපසු ලබාගැනීම සහ/හෝ භාණ්ඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ගෙවීම් සිදුකිරීම සඳහා භාවිත කළ හැකි ගෙවීම් කාඩ්පතක් අදහස් වේ;

(iii) ‘‘ක්‍රෙඩිට් කාඩ්පත’’ යන්නෙන්, නිකුත් කරන්නා විසින් කාඩ්පත්හිමියා වෙත ප්‍රදානය කරන ලද ණයවරයකින් සමන්විත වූද, භාවිත කර ඇති මුලු ණය මුදලම හෝ ඉන් යම් කොටසක් නිශ්චිතව දක්වා ඇති දින හෝ එදිනට පෙර ගෙවා අවසන් කළ හැකි වූද ගෙවීම් කාඩ්පතක් අදහස් වේ. නිකුත් කරන්නා විසින්, නිශ්චිතව දක්වා ඇති දිනට ගෙවා අවසන් කර නොමැති යම් මුදලක් මත පොලී හෝ වෙනත් ගාස්තු අයකරනු ලැබිය හැකි ය;

(iv) ‘‘පෞද්ගලික ස්වභාවය’’ යන්නෙන්, කාඩ්පත දරන්නාගේ භාවිතය සඳහා හෝ කාඩ්පත දරන්නාගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමාපියන්ගේ භාවිතය සඳහා පමණක් වන බව අදහස් වේ;

(v) ‘‘ජංගම ගනුදෙනු’’ යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථයම තිබිය යුතු ය;

(vi) ‘‘ප්‍රාග්ධන ගනුදෙනු’’ යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථයම තිබිය යුතු ය;

(vii) ‘‘තථ්‍ය ව්‍යවහාර මුදල්’’ යන්නෙන්, ඩිජිටල් ලෙස ගනුදෙනු කළහැකි සහ හුවමාරු මාධ්‍යයක් සහ/හෝ ගිණුම්

ඒකකයක් සහ/හෝ වටිනාකම් ගබඩාවක් ලෙස ක්‍රියාකරන එහෙත් යම් අධිකරණ බල ප්‍රදේශයක වලංගු මුදල් තත්ත්වය නොමැති සහ යම් අධිකරණ බල ප්‍රදේශයක් විසින් වලංගු මුදල් ලෙස නිකුත් නොකරන නැතහොත් සහතික නොකරන ඩිජිටල් වටිනාකම් නිරූපණයක් අදහස් වේ;

(viii) "ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය ප්‍රකාරව නිශ්චය කරනු ලැබිය යුතු ය.

14. ශ්‍රී ලංකාවේ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්ට EFTC කාඩ්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන නියමයන් නිශ්චිතව දක්වමින් බලයලත් වෙළෙන්දන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් මස 20 වන දින සහ 2017 අංක 02 දරන විධාන මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

15. ඉහත 14 වන ඡේදයේ සඳහන් විධාන ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින්, එම විධාන ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙරාතුව ඒ මත උපචිත වූ යම් අයිතිවාසිකම්වලට හෝ ඒ යටතේ දරන ලද දණ්ඩන හෝ වගකීම්වලට බලපෑමක් නොවිය යුතු ය.

16. මේ විධානවලින් අවසර දී ඇති කිසිවක් මගින්, බලයලත් වෙළෙන්දන් විසින් හෝ මේ විධාන යටතේ විදේශ විනිමය ගනුදෙනු කරන යම් තැනැත්තකු විසින් වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමේ නියමයෙන් නිදහස් කරන බවට, විමුක්ත කරන බවට හෝ වළක්වන බවට තේරුම් ගනු නොලැබිය යුතු ය.

17. මේ විධාන 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ**

**2021 මාර්තු මස 18 වන දින.**